# කාර්යසාධන වාර්තාව
# செயற்திறன் அறிக்கை
# Performance Report
# 2016

**අග්‍රාමාත්‍ය කාර්යාලය**
பிரதம அமைச்சர் அலுவலகம்
PRIME MINISTER'S OFFICE



# කාර්යසාධන වාර්තාව


**අග්‍රාමාත්‍ය කාර්යාලය**
**නො. 58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත**
**කොළඹ 07**

**දුරකථන : 011-2575317**
**ෆැක්ස් : 011-2574143**
**විද්‍යුත් ලිපිනය :** info@pmoffice.gov.lk
**වෙබ් අඩවිය :** www.pmoffice.gov.lk

# පටුන


මාතෘකාව පිටු අංකය

**01. හැඳින්වීම** **1**

1.1 දැක්ම 2
1.2 මෙහෙවර 2
1.3 කාර්යභාරය 2 - 3

**02. ප්‍රතිපත්ති සම්පාදනය හා ආර්ථික සංවර්ධනය** 5

2.1. ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව 6 - 7

2.2. ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු මෙහෙයුම් මැදිරිය 8 - 9

2.3. ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුව 10 - 11

2.4. මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කඩිනම් වැඩසටහන 12

2.5. ග්‍රාම රාජ්‍ය ඒකක 2500 ක් පිහිටුවීම 13 - 14

2.6. රාජ්‍ය සේවා සැපයුම් අධිකාරිය පිහිටුවීම 15

2.7. වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම 16 - 17

2.8. මත්ස්‍ය අපනයන තහනම ඉවත් කිරීම 18 - 19

2.9. GSP+ සහනය නැවත ලබා ගැනීම 20 - 21

2.10. ජපන් - ශ්‍රී ලංකා ඒකාබද්ධ සහයෝගීතා ලේකම් කාර්යාලය කොළඹ සහ ටෝකියෝ හි ස්ථාපිත කිරීම 22

2.11. ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය 23

2.12. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අධ්‍යයන කමිටුව 24 - 25

2.13. ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය 26

**මාතෘකාව** **පිටු අංකය**

**03. ජාත්‍යන්තර සහයෝගීතාවය වර්ධනය** 27

3.1. අග්‍රාමාත්‍යවරයාගේ නිල විදේශ සංචාර 28

3.1.1. ස්විට්සර්ලන්ත නිල සංචාරය - ලෝක ආර්ථික සමුළුව -2016 28 - 29

3.1.2. දකුණු කොරියානු නිල සංචාරය - රොටරි ජාත්‍යන්තර සමුළුව 30

3.1.3. සිංගප්පූරු නිල සංචාරය 31 - 32

3.1.4. ඉන්දුනීසියානු නිල සංචාරය - ලෝක ඉස්ලාමීය ආර්ථික සමුළුව 33

3.1.5. චීන නිල සංචාරය 34 - 35

3.1.6. සිංගප්පූරු නිල සංචාරය - ඉන්දීය සාගර සමුළුව -2016 36

3.1.7. නවසීලන්ත නිල සංචාරය 37

3.1.8. ඉන්දීය නිල සංචාරය 38

3.1.9. බෙල්ජියම් නිල සංචාරය 39

3.2. රාජ්‍යතාන්ත්‍රිකයන් සහ විදේශ නියෝජිතයන් සමග පැවති සාකච්ඡා 40 - 42

**04. ජාතික සංහිඳියාව, සමාජ සුභසාධනය සහ ආගමික කටයුතු** 43

4.1. ජාතික සංහිඳියාව 44

4.1.1. සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය 45 - 46

4.1.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා
මහජන අදහස් ලබා ගැනීම 47 - 48

4.2. සමාජ සේවා 49

4.2.1. සිංහල හා හින්දු අලුත් අවුරුදු උළෙල සැමරීම 49

4.2.2. ලේ දන්දීමේ ව්‍යාපාරය 50

4.2.3. මීරිගම වැඩිහිටි නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම 50

| මාතෘකාව | පිටු අංකය |
| --- | --- |
| 4.3. ආගමික කටයුතු | 51 |
| 4.3.1. කොළඹ නවම් මහා පෙරහැර | 51 |
| 4.3.2. මහා සංඝරත්නය දහස් නමක් විෂයයෙහි අරලියගහ මන්දිරයේදී පිරිනමන ලද සංඝගත දක්ෂිණාව | 52 |
| 4.3.3. සර්වඥ ධාතූන් වහන්සේලා ඇතුළු බෞද්ධ පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති භාණ්ඩ ප්‍රදර්ශනය | 53 - 54 |
| 4.3.4. බුද්ධ රශ්මි ජාතික වෙසක් මංගල්‍යය | 55 |
| 4.3.5. ඉෆ්තාර් උත්සවය | 56 |
| 4.3.6. කොල්ලුපිටිය වාළුකාරාම මහා විහාරස්ථ වාර්ෂික ඇසළ මහා පෙරහැර | 57 |
| 4.3.7. දීපවාලී උත්සවය | 58 |
| **05. මහජන පැමිණිලි/ දුක් ගැනවිලි සඳහා සහන සැලසීම** | 59 |
| 5.1. අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබෙන මහජන පැමිණිලි/ දුක් ගැනවිලි අදාළ රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම හා ප්‍රගතිය පසු විපරම් කිරීම | 60 - 61 |
| 5.2. අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය මඟින් මහජන පැමිණිලි / දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට පහසුකම් සැපයීම | 62 |
| **06. පාර්ලිමේන්තු සහ නීතිමය කටයුතු** | **63** |
| 6.1. පාර්ලිමේන්තු කටයුතු | 64 |
| 6.1.1. අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන් හා පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම | 64 |
| 6.1.2. පාර්ලිමේන්තු වාර්තා සභාගත කිරීම | 65 |
| 6.2. නීතිමය කටයුතු | 66 - 67 |
| **07. මානව සම්පත් සංවර්ධනය හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම** | **69** |
| 7.1. මානව සම්පත් සංවර්ධනය | 70 - 71 |
| 7.2. තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම | 72 - 74 |
| 7.3. අරලියගහ මන්දිර පරිශ්‍රය කළමනාකරණය | 75 |

**මාතෘකාව** **පිටු අංකය**

**08.** **මූල්‍ය ප්‍රගතිය** .......... **77**

8.1. මූල්‍ය ප්‍රගතිය .......... 78 - 79

# 01. හැඳින්වීම

## 1.1 දැක්ම

"ස්වාධීන, ස්වෛරී හා සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක්"

## 1.2 මෙහෙවර

"ශ්‍රී ලාංකීය ජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම පිණිසත්, ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම පිණිසත්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, යහපාලනයෙන් යුත් විශිෂ්ට රාජ්‍ය යාන්ත්‍රණයක් උදෙසා අවැසි නායකත්වයක් සැපයීම"

## 1.3 කාර්යභාරය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයාගේ නිල රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමයි.

එසේම, රජයේ මැතිවරණ ප්‍රකාශය වන "**මාස 60 කින් අලුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය**" ප්‍රකාරව,

- දේශීය ආර්ථිකය දියුණු කිරීම
- දූෂණය මුලිනුපුටා දැමීම
- නිදහස තහවුරු කිරීම
- යටිතල පහසුකම් සංවර්ධනය හා ආයෝජන  අවස්ථා ඇති කිරීම
- අධ්‍යාපනය ඉහළ නැංවීම

යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම කාර්යාලය සහයවනු ඇත.

තවද ;

- රජයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම

- අග්‍රාමාත්‍යවරයා මුලසුන හොබවන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය හා ඒවායේ ප්‍රගතිය පසුවිපරම් කිරීම

- අග්‍රාමාත්‍යවරයාගෙන් පාර්ලිමේන්තුවේදී විමසනු ලබන ප්‍රශ්න වලට පිළිතුරු සැකසීම

- අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට යොමු කරන පනත් කෙටුම්පත් වලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම

- අග්‍රාමාත්‍යවරයාට විදේශ දූත මණ්ඩල හා විදේශ තානාපති සේවයේ නිලධාරීන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සලසා දීම

- අග්‍රාමාත්‍යවරයාගේ විදේශ සංචාර සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙය වීම

- අග්‍රාමාත්‍යවරයා සහභාගීවන රාජ්‍ය හා ජාතික උත්සව සහ විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය ආවරණය සැපයීම

- විශේෂ ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන් රාජ්‍ය අනුග්‍රහය සහිතව සංවිධානය කිරීම

- අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරන මහජන පැමිණිලි හා දුක්ගැනවිලි, අදාළ ආයතන වෙත යොමු කර සහන සැලසීමට අවශ්‍ය කටයුතු කිරීම

- අරලියගහ මන්දිරය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ අග්‍රාමාත්‍යවරයාගේ නිල නිවාස නිසි පරිදි නඩත්තුකර පවත්වා ගෙන යාම

- අග්‍රාමාත්‍ය කාර්යාලයේ දෛනික පරිපාලන හා සංවර්ධන කටයුතු ඉටු කිරීම

# 02. ප්‍රතිපත්ති සම්පාදනය හා ආර්ථික සංවර්ධනය

## 2.1. ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව

ආර්ථික කළමනාකරණය හා ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 2015.09.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව ව්‍යවස්ථාපිත කරන ලද අතර, එහි කාර්යභාරය පහත පරිදි වේ;

1) ආර්ථික කටයුතු, මුදල් හා මුදල් ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය කටයුතු වලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

2) ජාතික ආයෝජන වැඩසටහන හා රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීමේ දී මාර්ගෝපදේශ සැපයීම හා පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා පහසුකම් සැපයීම

3) ආර්ථික හා මූල්‍ය ව්‍යාකූලතා සහිත යෝජනා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

4) රටෙහි ආයෝජනය / ආර්ථික සංවර්ධනය කෙරෙහි ඍජු බලපෑමක් ඇති විවිධ අණ පනත් ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කිරීම

කමිටු සංයුතිය;

| | |
|---|---|
| • ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා | අග්‍රාමාත්‍ය (සභාපති) |
| • ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා | ප්‍රවාහන අමාත්‍ය |
| • ගරු රවුෆ් හකීම් මැතිතුමා | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය |
| • ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා | ආපදා කළමනාකරණ අමාත්‍ය |
| • ගරු රවී කරුණානායක මැතිතුමා | මුදල් අමාත්‍ය |
| • ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා | මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය |
| • ගරු කබීර් හෂීම් මැතිතුමා | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය |
| • ගරු අර්ජුන රණතුංග මැතිතුමා | වරාය හා නාවික කටයුතු අමාත්‍ය |
| • ගරු සාගල රත්නායක මැතිතුමා | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය |
| • ගරු මලික් සමරවික්‍රම මැතිතුමා | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය |
| • ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා | විශේෂ කාර්යයන් පිළිබඳ අමාත්‍ය |

අග්‍රාමාත්‍ය ලේකම්වරයා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරයි.

2016 ජනවාරි මස සිට දෙසැම්බර් මස 31 දක්වා කාලය අතරතුර කමිටු රැස්වීම් 43 ක් පවත්වා ඇති අතර, එහිදී ප්‍රධාන ආර්ථික ගැටලු, ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු හා මූල්‍ය සංවර්ධන

උපායමාර්ග, අභ්‍යන්තර වෙළඳ, ගමනාගමන හා සිවිල් ගුවන් සේවා, වරාය හා නාවික, පුනර්ජනනීය බලශක්ති, මහාමාර්ග හා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ හා මාර්ගෝපදේශනයන්ට අදාළ තීරණයන් 931 ක පමණ ප්‍රමාණයකට විසඳුම් ලබා දී ඇත.

## 2.2. ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු ජාතික මෙහෙයුම් මැදිරිය

ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුව ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටු මෙහෙයුම් මැදිරිය අරලියගහ මන්දිරයේ පිහිටුවා ඇත.

එහි අධීක්ෂණ කටයුතු විශේෂ කාර්යභාර අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම මැතිතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය නිරෝෂන් පෙරේරා මැතිතුමා සම සභාපතීත්වය දරණ කමිටුවක් මගින් සිදුකරනු ලබයි. ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම්වරයෙකු මෙම කමිටුවෙහි අනෙකුත් සාමාජිකයන් වේ. ඉහත කමිටුවේ මඟ පෙන්වීම යටතේ ආර්ථික කළමණාකරණය පිළිබඳ කැබිනට් අනු කමිටු ජාතික මෙහෙයුම් මැදිරිය විසින් ආර්ථික කළමණාකරණය පිළිබඳ කැබිනට් අනු කමිටු රැස්වීම්ලට සමගාමීව 2016 වසර තුල රැස්වීම් 30 විශේෂ කාර්යභාර අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම මැතිතුමාගේ හා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය නිරෝෂන් පෙරේරා මැතිතුමාගේ සම ප්‍රධානත්වයෙන් හා අග්‍රමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක ජේ. චරිත රත්වත්තේ මහතා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ උපදේශක ආර්. පාස්කරලිංගම් මහතාගේ සහභාගිත්වයෙන් පවත්වා ඇත.

මෙම රැස්වීම් පැවැත්වීමේ අරමුණ වූයේ රාජ්‍ය සංවර්ධන ක්‍රියාවලියට දායක වන විවිධ අංශවල ව්‍යාපෘති පිළිබඳ අවධානය යොමු කොට පවතින ගැටලු සාකච්ඡා කර විසඳුම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමයි. ඒ අනුව, මේ වන විට සංචාරක කටයුතු ප්‍රවර්ධනය හා අයෝජන ව්‍යාපෘති, විදුලිය හා බලශක්ති ව්‍යාපෘති, ජල ව්‍යාපෘති හා ඉඩම් අත්පත්කර ගැනීම් වැනි ක්ෂේත්‍ර ගණනාවක ගැටලු නිරාකරණය කොට ඇත.

කැබිනට් තීරණයට අනුව ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටු මෙහෙයුම් මැදිරියට අදාළව පරිපාලන හා මූල්‍ය ඒකකයක් 2016 ජුලි මස 5 වන දින ස්ථාපිත කරන ලදී. පරිපාලන හා මූල්‍ය කළමනාකරණට අවශ්‍ය ප්‍රතිසංස්කරණ හා යෝජනා ඉදිරිපත් කිරීම මෙම කමිටුව පත් කිරීමේ අරමුණ වේ.

මීට අමතරව අග්‍රාමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක ජේ චරිත රත්වත්තේ මහතාගේ මඟ පෙන්වීම යටතේ ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටු ජාතික මෙහෙයුම් මැදිරිය විසින් වර්තමාන ජාතික වැදගත්කමක් ඇති පහත සාරාංශ කර ඇති කාර්යයන් සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

1) වී මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම - 2016 - මහ කන්නය.

ඒ අනුව, අම්පාර, කුරුණෑගල, පොළොන්නරුව සහ අනෙකුත් දිස්ත්‍රික්කයන්හි වී මිලදී ගැනීම පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය කළ අතර වී මිලදී ගැනීම අවශ්‍ය ඉලක්ක වෙත ළඟාවීමෙන් අනතුරුව මෙම වැඩසටහන 2016 මැයි මස නිමා විය.

2) විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි යන විෂයන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සමඟ දිවයින පුරා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. ඒ අනුව, මේ වන විට ගුරුවරු 451 දෙනෙකු නැගෙනහිර, උතුරු, සබරගමුව, ඌව යන පළාත් වලින් බඳවා ගෙන ඇත.

3) ශාරීරික සුවතා අධ්‍යයන ගුරුවරු බඳවා ගැනීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම - මූලික සාකච්ඡා සිදු කර ඇත.

4) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය හා ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සමාජ ආරක්ෂණ දත්ත පද්ධතිය සැකසීම ක්‍රියාත්මක කිරීම.

5) රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හා මහජන බැංකුව සමඟ ක්ෂුද්‍ර මූල්‍ය ණය පනත ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

6) ජාතික යොවුන් සේනාංකය හා තරුණ සේවා නියමු ව්‍යාපෘතියෙහි ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

7) දිවයින පුරා රුධිර කාන්දුකරණ යන්ත්‍ර 900 ක් ස්ථාපිත කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ මූලික සාකච්ඡා Health Services Pvt Ltd India හා සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ පවත්වන ලද අතර ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.

8) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සමඟ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය කිරීම. (විමධ්‍යගත අයවැය හා ග්‍රාමීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘති මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් )

## 2.3. ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුව

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවට, ආර්ථික කළමනාකරණය සම්බන්ධ කරුණු අධ්‍යයනය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් 2015.10.09 දින සිට ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුව පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථිකයට ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් සපයනු ලබන ප්‍රධාන ආයතන නියෝජනය වන පරිදි මෙම කමිටුවේ සාමාජිකයින් පත් කර ඇත.

**කමිටුවේ සංයුතිය ;**

| | |
|---|---|
| • ආර් පාස්කරලිංගම් මහතා | ජ්‍යෙෂ්ඨ උපදේශක, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය (සභාපති) |
| • ජේ චරිත රත්වත්තෙ මහතා | අග්‍රාමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක |
| • සුමිත් අබේසිංහ මහතා | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් |
| • ආචාර්ය ආර් එච් එස් සමරතුංග මහතා | ලේකම්, මුදල් අමාත්‍යාංශය |
| • එම් අයි එම් රෆීක් මහතා | ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| • එම් සී එල් රොද්‍රිගෝ මහතා (2016.11.04 දින දක්වා) | අතිරේක ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය |

**කමිටුවේ කාර්යභාරය ;**

1) ආර්ථික කටයුතු, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය කටයුතු වලට අදාළව, අමාත්‍ය මණ්ඩල සංදේශ වල සඳහන් කරුණු අධ්‍යයනය කර ඒ සම්බන්ධව නිර්දේශ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත ඉදිරිපත් කිරීම

2) පෞද්ගලික අංශයේ ආයෝජකයින් විසින් ඉදිරිපත් කරනු ලබන විවිධ ව්‍යාපෘති වාර්තා සඳහා සුදුසු ප්‍රතිපත්තිමය මඟ පෙන්වීමක් ලබා දීම

3) ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුවට යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම් ලබාදීම හා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවෙහි අවධානය සඳහා යොමු කිරීම

4) ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුව හා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් ගනු ලබන තීරණ වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම

2016 වසර තුළ මෙම කමිටුවේ රැස්වීම් වාර 35 ක් පවත්වා ඇත. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශය විසින් තව දුරටත් ක්‍රියාමාර්ග ගත යුතු කරුණු, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සහ අනෙකුත් ඉල්ලීම් 486 ක් සඳහා මෙම කමිටුව විසින් නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දී ඇත.

## 2.4. මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කඩිනම් වැඩසටහන

**"මාස 60 කින් අලුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය"** ප්‍රකාරව, මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීමේ සහ යටිතල පහසුකම් සැපයීමේ කඩිනම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක ආර් පාස්කරලිංගම් මහතාගේ සභාපතිත්වයෙන් හා අග්‍රාමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක ජේ චරිත රත්වත්තෙ මහතා ඇතුළු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ අනෙකුත් ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කර ඇත.

රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය (Public Private Partnership) යටතේ ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මඟින් මේ වන විට නිවාස ව්‍යාපෘති 06 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

| අංකය | ව්‍යාපෘතිය | නිවාස ඒකක සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නුග ගහ කනත්තවත්ත - පානදුර | 196 |
| 02 | දම්බුවාවත්ත - රාගම | 124 |
| 03 | වැරැල්ලවත්ත ලංකාලෝහ ඉඩම - යක්කල | 669 හා වෙළඳ සංකීර්ණයක් |
| 04 | ඉස්කාගාර වත්ත - කුණ්ඩසාලේ | 340 |
| 05 | මවුන්ට් ක්ලිෆර්ඩ් වත්ත - හෝමාගම | 600 |
| 06 | ජල්තර අදියර II - හෝමාගම | 352 |

මෙහිදී නිවාස ඉදිකිරීම සඳහා පොදු පහසුකම් සහිත ඉඩම් ලබාදීම, නළ ජලය, විදුලි බලය, මංමාවත් ආදී යටිතල පහසුකම් සැපයීම හා නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය අනුමැතිය කඩිනමින් ලබාදීම රජය විසින් සිදු කරනු ඇත.

තවද, ප්‍රතිලාභීන් වෙත නිවාස අලෙවි කිරීමේ මිල ගණන් තීරණය කරනු ලබන්නේ ද රජය විසිනි. එමෙන්ම ප්‍රතිලාභීන්ට නිවාස මිලදී ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් සහන පොලී අනුපාතයන් යටතේ ණය පහසුකම් ලබාදීමට ද අවශ්‍ය කටයුතු සලසා ඇත.

## 2.5. ග්‍රාම රාජ්‍ය ඒකක 2500 ක් පිහිටුවීම

ග්‍රාමීය ප්‍රදේශයන්හි සමාජීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනය, සමාජ සුභ සාධනය, දේපළ හිමිකාරීත්වය තහවුරු කිරීම ආදී සංකල්පයන් හරහා ග්‍රාමීය සංවර්ධන ක්‍රියාදාමයන් විධිමත් කරමින්, ජාතික ආර්ථික වර්ධනයට ධනාත්මක බලපෑමක් ඇති කිරීමේ අරමුණු සහිතව පංචවිධ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ග්‍රාම රාජ්‍ය ඒකක නමින් පොකුරු ගම්මාන 2500 ක් ස්ථාපිත කෙරෙණු ඇත.

යෝජිත සැලසුමට අනුව, ග්‍රාම නිලධාරී කොට්ඨාස හතරක් හෝ පහක් ඒකාබද්ධ කිරීමෙන් ග්‍රාම රාජ්‍ය ඒකකයක් ස්ථාපිත කෙරේ. "ග්‍රාමීන් අලෙවිකරණ සංකල්පය" යටතේ සර්ව සම්පූර්ණ ආර්ථික මධ්‍යස්ථානයන් මෙම පොකුරු ගම්මානවල ස්ථාපනය කෙරෙන අතර, ග්‍රාම පරිපාලනය එකී ගම්වාසීන් විසින්ම මෙහෙයවනු ඇත. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් යටතේ ග්‍රාම රාජ්‍ය ඒකක අටක් හෝ දහයක් පවත්වාගෙන යාමට අපේක්ෂිත අතර, මෙම පරිපාලන කොට්ඨාසය නියාමන, අධීක්ෂණ හා සහාය සේවා ව්‍යුහයකින් මෙන්ම ක්‍රියාකාරී ව්‍යුහයකින්ද සමන්විත වනු ඇත. සෑම ග්‍රාම රාජ්‍ය ඒකකයකටම අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන් මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඔස්සේ ලබා දීමට අපේක්ෂිතය.

ග්‍රාම රාජ්‍ය ඒකකවල අරමුණු;

1) රටෙහි සමාජීය, ආර්ථික සහ සංස්කෘතික යන අංශයන්හි තිරසාර සංවර්ධනයක් ඇති කිරීම උදෙසා දේශීය ප්‍රජා සහභාගිත්වය සක්‍රීය හා අර්ථාන්විත අයුරින් යොදා ගනිමින්, පූර්ව නිශ්චිත ප්‍රදේශයක් තුළ, ආයතනික යාන්ත්‍රණයක් ලෙස කටයුතු කිරීමට අවස්ථාව සැලසීම.

2) මනාව සංරක්ෂිත හා ස්වාභාවික සම්පත් වලින් සමන්විත පරිසරය, සෞඛ්‍ය සම්පන්න ජනතාව, උගත් ප්‍රජාව, සමාජ සත්කාරක හා සාධාරණ සමාජය, ආර්ථික සශ්‍රීකත්වය හා උසස් නිෂ්පාදන ධාරිතාව, සාමාජීය සමගි සම්පන්නභාවය, සේවා සැපයීම හා පරිභෝජනය යන සාධකයන්ගෙන් සමන්විත තිරසාර සමාජයක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කිරීම.

3) ප්‍රදේශයෙහි සංවර්ධනයට අදාළ ජනතා අදහස් සහ ප්‍රමුඛ ප්‍රජා සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් හඬ නගමින්, ප්‍රජාව සහ රජය අතර ධනාත්මක අන්තර් ක්‍රියා නිර්මාණය කිරීමට මඟපාදන වේදිකාවක් නිර්මාණය කිරීම සහ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම.

ග්‍රාම රාජ්‍ය ඒකක 2500 ක් ස්ථාපනය කිරීම සඳහා සකස් කරන ලද සංකල්ප පත්‍රිකාව, අමාත්‍ය මණ්ඩලයේ නිරීක්ෂණ සඳහා යොමු කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පාර්ලිමේන්තුවේ අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අදහස් ලබා ගැනීම සඳහා යොමු කරන ලදී. ඒ අනුව ආංශික අධීක්ෂණ කමිටුව විසින් ග්‍රාම රාජ්‍ය සංකල්ප පත්‍රිකාව සකස් කිරීමට අදාළ කමිටුව සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, කමිටුවේ නිරීක්ෂණ ඉදිරියේ දී ලැබීමට නියමිතය.

## 2.6. රාජ්‍ය සේවා සැපයුම් අධිකාරිය පිහිටුවීම

පළාත් රාජ්‍ය සේවය සහ ආයතන ඇතුළු රාජ්‍ය සේවය විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් සහතික කිරීම සඳහා රාජ්‍ය සේවා සැපයුම් අධිකාරිය නමින් අධිකාරියක් ස්ථාපිත කිරීමේ කටයුතු අධ්‍යයනය හා විශ්ලේෂණය කිරීම පිණිස, බහුවිධ ශික්ෂණධාරී අධ්‍යයන මණ්ඩලයක් පත් කර ඇත.

මෙම අධ්‍යයන මණ්ඩලය විසින් හෙළිකර ගන්නා ලද කරුණු මත පදනම්ව, රාජ්‍ය සේවා සැපයුම් අධිකාරිය ස්ථාපිත කිරීම සඳහා පනත් කෙටුම්පතක් සම්පාදනය කිරීම සඳහා සොලිසිටර් ජනරාල්වරයාගේ සභාපතිත්වයෙන් යුත් විද්වත් කමිටුවක් පත් කෙරිණ. මෙම කමිටුව, නීතිපති, නීති කෙටුම්පත් සම්පාදකගේ නියෝජිතයින්, ජනාධිපති ලේකම් කාර්යාලය සහ අමාත්‍යාංශ ගණනාවක් නියෝජනය කෙරෙන ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, විශ්වවිද්‍යාල විද්වතුන්, විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් සහ පෞද්ගලික අංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

රාජ්‍ය සේවා සැපයුම් අධිකාරිය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු ;

1) ජනතා කේන්ද්‍රීයගත රාජ්‍ය සේවාවක් සහතික වීම
2) ජනතා අභිලාෂයන් සපුරාලන, කාර්යක්ෂම, ප්‍රශස්ත, ගුණාත්මකභාවයෙන් හා ඉහළ ප්‍රමිතියකින් යුක්ත වූ සේවාවක් මහජනතාව වෙත සලසා දිය හැකි අයුරින් රාජ්‍ය සේවය සහ රාජ්‍ය ආයතන මෙහෙය වීම
3) රාජ්‍ය අංශයෙහි සේවකයින් අභිප්‍රේරණය සඳහා ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීම සහ රාජකාරි බද්ධ පුහුණු ලබා දීම
4) කාලීන අවශ්‍යතාවයන් මත පදනම්ව යෝග්‍ය සේවා ප්‍රමිතීන් ස්ථාපිත කිරීම සහ ඒ හා අනුගත වීම සඳහා රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය පියවර ගැනීම
5) සියලුම රාජ්‍ය සේවාවන්ට අපක්ෂපාතී සහ සාධාරණ ප්‍රවේශයක් සැලසීම සහ සේවාලාභීන්ගේ පැමිණිලි හා දුක්ගැනවිලි සම්බන්ධයෙන් පියවර ගැනීම
6) කාර්යක්ෂම සහ මිත්‍රශීලී සේවාවක් සඳහා වන පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම

පත් කරන ලද විද්වත් කමිටුව විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත, නිරීක්ෂණ සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩලය විසින් පාර්ලිමේන්තුවේ අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අදහස් ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ආංශික අධීක්ෂණ කාරක සභාවේ නිරීක්ෂණ 2017 ජනවාරි මස අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට අපේක්ෂිතය.

## 2.7. වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය 2014 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. එහිදී මුහුද ගොඩකර, සුඛෝපභෝගී හෝටල් හා නිවාස සංකීර්ණ, සාප්පු සංකීර්ණ, කාර්යාල සංකීර්ණ, විනෝද යාත්‍රා වරාය, මෝටර් රථ ධාවන තරඟ මංතීරු වැනි විවේකය හා විනෝදය දනවන ක්‍රියාකාරකම් ආදිය සහිතව භූමි භාගයක් සංවර්ධනය කිරීම අරමුණු කෙරුණු අතර, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් චීනයේ, චයිනා කමියුනිකේෂන් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් යන සමාගම සමඟ ගිවිසුමකට එළඹිණි.

2015 මාර්තු මස ජනාධිපති, අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වය යටතේ එම ව්‍යාපෘතිය අඛණ්ඩව කර ගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, එහිදී එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් උද්ගතව තිබූ ප්‍රධාන පරිපාලන හා කළමණාකරන ගැටලු සහ පරිපූරක පාරිසරික බලපෑම් සම්බන්ධයෙන් ඇඟයීම් නිම කෙරෙන තුරු, වරාය නගරයේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවන ලදී.

ඒ අනුව, මෙම ව්‍යාපෘතියට අදාළ ගැටලු නිරාකරණය කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ලේකම්වරුන්ගේ කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුව විසින් චීන සමාගම සමඟ පැවති පළමු ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලද අතර, එම ගිවිසුම නැවත සමාලෝචනය කිරීමට තීරණය කරන ලදී.

ව්‍යාපෘති සමාලෝචනයෙන් අනතුරුව, ගිවිසුම සංශෝධනය කිරීමට කමිටුව විසින් නිර්දේශ කෙරිණ. ඒ අනුව, පරිපූරක පාරිසරික බලපෑම් ඇගයීම නිම කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමටත් සංවර්ධන බලපත්‍රයක් නිකුත් කිරීමටත් කමිටුව තීරණය කරන ලදී.

පළමු ගිවිසුම යටතේ, පීඩාවට ලක්වූ ධීවර ප්‍රජාවට වන්දි ගෙවීම සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයේ වගකීමක් වූ අතර, නව සංශෝධන යටතේ එසේ ගෙවිය යුතු වන්දි වෙනුවෙන් දායකත්වය සැපයීමට ව්‍යාපෘති සමාගම එකඟත්වය පළ කර ඇත. ඒ අනුව පීඩාවට ලක්වූ ධීවර ප්‍රජාවගේ ජීවන ක්‍රමය නැංවීම සඳහා ව්‍යාපෘති කමිටුව මඟින් රු.මි.500 ක මුදලක් වෙන් කර ඇත. එය ධීවර හා ජලජ සම්පත්, මහ නගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශ වල අධීක්ෂණය හා මඟ පෙන්වීම යටතේ විශේෂිත කාර්ය පටිපාටියකට අනුව නිසි උපයෝජනයක් වන පරිදි කාර්යක්ෂමව සිදුකිරීමට අපේක්ෂිතය.

එසේම, මෙම ව්‍යාපෘතිය යටතේ ගොඩ කරනු ලබන භූමිය වෙනම නීති පද්ධතියක් යටතේ, මූල්‍ය නගරයක් සඳහා භාවිතයට ලබාගත යුතුය යන පදනම සහිතව, ශ්‍රී ලංකා රජය සමඟ නැවත සාකච්ඡා කිරීමට ව්‍යාපෘති සමාගම එකඟ වී ඇත. මූල්‍ය නගර ස්ථාපනය සහ මූල්‍ය නගර සංස්ථාව නීතිගත කිරීමේ කටයුතු වෙනම පාර්ලිමේන්තු පනතක් මඟින් සිදු කෙරෙනු ඇත.

අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ලේකම්වරුන්ගේ කමිටුව වර්තමානයේ යෝජිත මූල්‍ය නගරය සඳහා නෛතික රාමුව, ව්‍යාපාර සැලස්ම සහ ආයෝජන සැලැස්ම භාරව කටයුතු කරන අතර, අදාළ පාර්ශ්වයන් සඳහා මාර්ගෝපදේශ සපයමින් වරාය නගර ව්‍යාපෘති කටයුතු මෙහෙයවනු ලැබේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන උපායමාර්ගික ගැටළු විසඳා ගැනීම සඳහා මෙහෙයුම් කමිටුවක් (Steering Committee) පත් කර ගැනීම සිදුවිය. එම ගැටළු විවිධ ක්ෂේත්‍රයන්ට අදාල බැවින් ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාල පාර්ශවයන් සම්බන්ධ කර අදාල ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම් “Joint Working Groups” පත් කර ගැනීම ඒ යටතේ සිදුවේ.

## 2.8. මත්ස්‍ය අපනයන තහනම ඉවත් කිරීම

නීති විරෝධී, වාර්තා නොවූ සහ නියාමනය නොවන ධීවර කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කරන බව විදහා දැක්වීමට ශ්‍රී ලංකා රජය අපොහොසත් වීම හේතුවෙන්, ශ්‍රී ලංකාව විසින් සිදු කරනු ලබන මුහුදු ආහාර යුරෝපා සංගමයේ රටවලට අපනයනය තහනම් කිරීමට 2014 ඔක්තෝබර් මාසයේ දී, යුරෝපා කොමිසම විසින් පියවර ගනු ලැබිණ. මෙම තහනම 2015 ජනවාරි මස 15 වන දින සිට ක්‍රියාත්මක විය. යුරෝපා සංගමයේ රටවලට අලුත් හා ශීතකළ තලපත් හා බල මාළු අපනයනය කරනු ලබන දෙවන විශාලතම අපනයනකරු ශ්‍රී ලංකාව වන අතර, 2013 වසරේ දී කරන ලද අපනයනයන්හි වටිනාකම යුරෝ මිලියන 74 ක් විය. එම තහනම ඔස්සේ ශ්‍රී ලංකාවට වූ අලාභය දළ වශයෙන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් පමණ විය.

යුරෝපා සංගම් නීති විරෝධී, වාර්තා නොවූ සහ නියාමනය නොවන ධීවර කටයුතුවලට අදාළ රෙගුලාසි යටතේ, ශ්‍රී ලංකාව හුදෙක් සහය නොදක්වන රටක් ලෙස ලැයිස්තුගත වීම, ඉවත් කර ගැනීමේ පසුවිපරම් කටයුතු සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් මෙහෙයුම් කමිටුවක් පත් කරන ලද අතර, ධීවර අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව සහ මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය යන ආයතනවල නියෝජිතයින්ගෙන් සැදුම්ලත් මෙම කමිටුවේ ප්‍රධානත්වය අග්‍රාමාත්‍ය ලේකම් විසින් දරන ලදී.

මෙහෙයුම් කමිටුවේ මඟපෙන්වීම සහ අධීක්ෂණය යටතේ පසුගිය වසර තුළදී නිම කරන ලද වැදගත් කාර්යයන් වශයෙන් යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, අවශ්‍ය රෙගුලාසි සහ සම්බාධක හඳුන්වා දීම, අමතර අයවැය ප්‍රතිපාදන ලබාදීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ඇතුළත් විය.

මත්ස්‍ය අපනයන තහනම ඉවත් කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදයෙහි ක්‍රමික ප්‍රගති සමාලෝචනයක යෙදෙන මෙහෙයුම් කමිටුව, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාකරණයෙහි නියැලී සිටී. එමෙන්ම, යුරෝපා කොමිසමෙහි සමුද්‍රීය කටයුතු භාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාක්ෂාත් කර ගනු ලබන ප්‍රගතිය අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබන අතර, කළමනාකරණ කටයුතු නිසි පරිදි සිදු කෙරෙන බව සහතික කර ගැනීම සඳහා 2015 නොවැම්බර් මාසයේ දී දූත පිරිසක් සංචාරයක නිරත විය.

ඒ අනුව, 2016 අප්‍රේල් මස 06 වන දින ධීවර බලධාරීන් හා සමුද්‍රීය කටයුතු භාර අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ පැවති අවසාන නිගමනයකට එළඹීමේ සාකච්ඡාවේ දී, ධීවර කර්මාන්තය සඳහා පෘථුල හා ශක්තිමත් කළමනාකරණ ක්‍රමවේදයන් සහ නීති විරෝධී, වාර්තා නොවූ සහ නියාමනය නොවන ධීවර කටයුතු මැඩලීමේ ක්‍රමවේදයන් ශ්‍රී ලංකාව විසින් අනුගමනය කරන බව සමුද්‍රීය කටයුතු භාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගන්නා ලදී.

ස්වකීය යුතුකම් භාරයෙහිලා ධජ රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව විසින් කරනු ලබන ක්‍රියාකාරකම්, සමුද්‍ර නීතියට අදාළ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 94, 117 සහ 118 වන වගන්ති සහ එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය ව්‍යාපාර වස්තු ගිවිසුමෙහි 18, 19 හා 20 වන වගන්තිවලට අනුරූපීව ක්‍රියා කිරීම සඳහා ප්‍රමාණවත් බව යුරෝපා කොමිසම විසින් ඉහත සඳහන් පදනම මත තීරණය කරන ලදී. ශ්‍රී ලංකාව ලැයිස්තුගත කිරීම සඳහා පාදක වූ පසුබිම නිවැරදි කර ගෙන ඇති බව ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලින් ප්‍රදර්ශනය වන බවත්, දිගු කාලීනව ඒ සම්බන්ධයෙන් ඉහළ ප්‍රගතියක් සාක්ෂාත් කර ගැනීමෙහි ලා කඩිනම් පියවර ශ්‍රී ලංකාව විසින් ගෙන ඇති බවත් කොමිසමේ නිගමනය විය.

යථෝක්ත සියලු කරුණු මත පදනම්ව 2016 ජූනි මස21 වන දින සිට බලපවත්නා පරිදි, සහාය නොදක්වන තෙවන රටවල ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කළ යුතු බවට කවුන්සිලය විසින් තීරණය කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකාව විසින් යුරෝපා සංගම් රටවලට කෙරෙන මත්ස්‍ය අපනයනයන් යළිත් ආරම්භ කිරීමට අපේක්ෂිත අතර, මත්ස්‍ය නිෂ්පාදන අපනයනය මඟින් ආර්ථිකයට ඇ.එ.ජ.ඩොලර් මිලියන 100 ක පමණ ආදායකත්වයක් ද අපේක්ෂා කෙරේ.

## 2.9. GSP+ සහනය නැවත ලබා ගැනීම

2009 මැයි මාසයේ දී යුද්ධය නිම වීමෙන් පසුව රටෙහි සාමාන්‍ය තත්ත්වයක් ස්ථාපිත කර, ශ්‍රී ලංකාවේ අයිතිවාසිකම් හා සංවර්ධනය සුරක්ෂිත වූ වාතාවරණයක් ස්ථාපිත කර ගැනීමෙහි ලා ශ්‍රී ලංකාව විශිෂ්ට ප්‍රගතියක් ලබා ඇත. කෙසේවුවද, ඉන් අනතුරුව යුද්ධය පැවති කාල පරාසය තුළදී මානව හිමිකම් සුරක්ෂිත කර ගැනීමෙහි ලා සැලකිය යුතු අභියෝගයන් ද රට තුළ ඉස්මතු වීම අඛණ්ඩව සිදු විය.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වයට අදාළව, යුරෝපීය කොමිසම සහ ශ්‍රී ලංකාව අතර පැවති සංවාදය සම්බන්ධයෙන් යුරෝපීය කොමිසම විසින් 2010 ජූනි මස 17 වන දින, එවකට විදේශ කටයුතු අමාත්‍යවරයා වෙත ලිඛිතව දැන්වූ අතර, GSP+ ප්‍රතිලාභය ප්‍රකෘතිමත් කර ගැනීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට ශ්‍රී ලංකාව විසින් අවධානය යොමු කළ යුතු, එහෙත් නොවිසඳී පවත්නා ගැටලු 15 ක් මෙම ලිපියට ඇතුළත් කර තිබුණි.

2016.07.12 වන දින එම ගැටලු 15 යටතේ, අදාළ අයදුම්පතෙහි එකඟත්වය පළ කර ඇති බැඳීම් භාරය ඉටු කරලීම සඳහා ශ්‍රී ලංකාව සත්‍ය වශයෙන්ම අවශ්‍ය පියවර ගෙන ඇති බව තහවුරු කෙරෙණ ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කරන ලෙස යුරෝපා සංගමය ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටින ලදී. පැවරී ඇති ප්‍රතිපාදන යටතේ එම අයදුම්පත විශ්ලේෂණය කිරීමට සහ අදාළ උපමානයන් සපුරා ඇත්නම් ශ්‍රී ලංකාවට GSP+ සහනය නැවත ලබාදීම පිළිබඳව යෝජනා කිරීමට 2016.07.12 වන දින සිට 2017.01.12 දින දක්වා වූ මාස 6 ක කාල පරාසයක් යුරෝපා සංගමයට හිමි වේ.

ක්‍රියාකාරිත්ව ලක්ෂ්‍යයන් 58 ක් ඇතුළත් කොට යාවත්කාලීන කරන ලද න්‍යාසය, කාල පරාසයන්ද සහිතව 2016 සැප්තැම්බර් මස 30 වන දිනට පෙර භාරදෙන ලෙස යුරෝපීය කොමිසම ඉල්ලා සිටින ලදී. ඒ අනුව, ක්‍රියාකාරිත්ව ලක්ෂ්‍යයන් 58 ඇතුළත් කොට යාවත්කාලීන කළ න්‍යාසය සහ 2016 සැප්තැම්බර් මස 21 වන දින අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමෙන් පසුව ඉදිරිපත් වූ ප්‍රතිචාරයන්ද, අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් යුරෝපීය කොමිසම වෙත යවා ඇත.

GSP+ සහනය නැවත ලබාගැනීම සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් කිහිපයක්, අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, මේ පිළිබඳ වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් 2016 ඔක්තෝබර් මස 17 දින සිට 20 දින දක්වා බ්‍රසල්ස්හි දී යුරෝපා සංගමයෙහි නායකයන් සහ තානාපතිවරුන් සමග සාකච්ඡාවක් පවත්වන ලදී.

එමෙන්ම එක්සත් ජාතීන් හා එක්සත් ජාතීන්ගේ ගිවිසුම්කාර ආයතනයන් ඇතුළු වෙනත් බහු පාර්ශ්වික ආයතන සමඟ පවත්වා ගෙන යනු ලබන සහ සම්බන්ධතාවයන් වඩාත් ශක්තිමත් කර ගැනීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ද ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇත. යුරෝපා සංගමය සමඟ ශ්‍රී ලංකාව පවත්වා ගෙන යනු ලබන සාධනීය සම්බන්ධතාවය ද, ඒ අනුව යහපාලනය, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් වලට අදාළව යුරෝපා කොමිසම ශ්‍රී ලංකා ක්‍රියාකාරිත්ව මණ්ඩලයක් ස්ථාපිත කිරීමද මෙම ප්‍රතිපත්තියෙන් විදහා දැක්වේ. එම නිසා, යුරෝපා කොමිසම සමඟ ඇති සබඳතා ශක්තිමත් කර ගැනීමෙහිලා මෙන්ම, යහපාලනය, නීතියේ ආධිපත්‍ය සහ මානව හිමිකම් ශ්‍රී ලංකාව තුළ අන්‍යෝන්‍ය වශයෙන් ආරක්ෂා කර ගැනීම, ප්‍රවර්ධනය හා සාක්ෂාත් කර ගැනීමෙහිලා රජයේ දැඩි කැපවීමද GSP+ සහනය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අයැදුමෙන් පැහැදිලිව ප්‍රකාශ වේ.

## 2.10. ජපන් - ශ්‍රී ලංකා ඒකාබද්ධ සහයෝගීතා ලේකම් කාර්යාලය කොළඹ සහ ටෝකියෝ හි ස්ථාපිත කිරීම

2015 ඔක්තෝබර් මස අග්‍රාමාත්‍යවරයාගේ ජපන් නිල සංචාරයේ දී, ජපන් රජය සහ ශ්‍රී ලංකා රජය විසින් ඒකාබද්ධ සහයෝගීතාවය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් එකඟත්වයක් ඇති කර ගන්නා ලදී. මෙය ශ්‍රී ලංකා රජය, මාස 60ක් තුළ ක්‍රියාත්මක කරන්නා වූ ජාතික සංවර්ධන වැඩසටහනෙහි අන්තර් සහයෝගීතාවය ගොඩනැගීමේ ජාත්‍යන්තර ගිවිසුම් මාලාවේ එක් ගිවිසුමකි.

ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයෙහි කේන්ද්‍රීය ක්ෂේත්‍රයන් ලෙස හඳුනා ගෙන ඇති, උසස් මට්ටමේ කෘෂිකර්මාන්තය, කර්මාන්ත සඳහා වූ විද්‍යා හා තාක්ෂණය, උසස් තත්ත්වයෙන් යුත් යටිතල පහසුකම් හා ප්‍රාදේශීය සංවර්ධනය, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය සහ සිවිල් ආරක්ෂාව හා සුරක්ෂිතතාවය යන අංශ කෙරෙහි මෙමඟින් අවධානය යොමු කර ඇත.

යෝජිත ඒකාබද්ධ සහයෝගීතා ලේකම් කාර්යාලය පිහිටුවීම මඟින් පහත සඳහන් මූලික පරමාර්ථ ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අතර, ඒ සඳහා දෙරටෙහි අදාළ රාජ්‍ය ආයතන අතර ක්‍රියාකාරකම්හි කාර්යාලමය සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමට අපේක්ෂිතය.

1) සමතුලිත සහ පරිපූර්ණ සංවර්ධනය ඇති කිරීම
2) ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම්, ගෝලීය අගයදාමය හා ඒකාබද්ධ කිරීම
3) විද්‍යා හා තාක්ෂණයෙහි විශිෂ්ටත්වය පෝෂණය කිරීම
4) ශ්‍රී ලංකාවෙහි අධි තාක්ෂණ කර්මාන්ත ප්‍රවර්ධනය
5) ප්‍රතිඵල මුල් කොටගත් මානව සම්පත් සංවර්ධනය අවධාරණය කෙරෙමින් ඊ - රාජ්‍ය මූලයන්ට සහාය දැක්වීම

ජපන් ශ්‍රී ලංකා ඒකාබද්ධ සහයෝගීතාවයෙහි අරමුණු ඉටුකර ගනු වස්, ශ්‍රී ලංකා රජය මගින් ජපානයේ ටෝකියෝහි සහ ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටුවා ඇති ජපන් ශ්‍රී ලංකා ඒකාබද්ධ සහයෝගීතා ලේකම් කාර්යාල සමග කටයුතු කිරීමට හැකි වන ලෙස අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ ආයතනික විධිවිධාන පනවා ඇත. ටෝකියෝහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය තුළ ශ්‍රී ලංකා රජය මගින් ස්ථාපිත ජපන් ශ්‍රී ලංකා ඒකාබද්ධ සහයෝගීතා ලේකම් කාර්යාලය පිහිටා ඇති අතර, මේවන විට ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවාගෙන එමගින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් පිළිබඳ එකඟතාවයකට පැමිණ ඇත.

## 2.11. ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය

ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන ඉලක්ක කරා කඩිනමින් ළඟා වීමට පැහැදිලි, පිළිගත හැකි සහ සාධාරණ වූ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ මූලික අරමුණ පෙරදැරිව "ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය" අග්‍රාමාත්‍ය කාර්යාලයේ ස්ථාපිත කර ඇත. නව රජයේ කාර්යයන් වේගවත් කිරීමට සහය වන, මෙම ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය මඟින් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතය.

1) ජාතික ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා සම්පාදනය කිරීම
2) ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය සම්බන්ධීකරණය කිරීම
3) ප්‍රතිපත්ති සමාලෝචනය හා ඇගයීම
4) ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමය කෙරෙහි බාහිර සාධකයන්ගේ බලපෑම සමාලෝචනය කිරීම

මෙම කාර්යාලය පහත සඳහන් කාර්යයන් පිළිබඳ ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටීන් සම්බන්ධයෙන් අවශ්‍ය මඟ පෙන්වීම් සහ සම්බන්ධීකරණය සිදු කර ඇත.

(i) සංස්ථාපිත වස්තු භංගත්ව නීතිවල සංස්ථාපිත නීති ප්‍රතිසංස්කරණය

(ii) ආයෝජන (විශේෂ විධිවිධාන) පනත

(iii) වෘත්තීය හා තාක්ෂණික පුහුණු කමිටුව

මෙම කමිටුව යටතේ ළමා සුරැකුම්, වැඩිහිටි සුරැකුම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, සංචාරක කර්මාන්තය, ඉදිකිරීම්, ලුහු ඉංජිනේරු, දත්ත, ප්‍රචාරණය, ශ්‍රමික ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය, කාන්තාවන්, වෙනස් වූ හැකියාවන් සහිත පුද්ගලයින්, පාසලේ සිට වැඩබිමට සංක්‍රමණයවන්නන් සම්බන්ධ දත්ත පද්ධතිය ආදී අනු කමිටු ක්‍රියාත්මක වේ.

(iv) ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තියක් සම්පාදනය

(v) මද්‍යසාර බදු ප්‍රතිපත්තිය

(vi) සූර්ය කිරණ විදුලි ප්‍රතිපත්තිය

(vii) ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රතිපත්තිය

(viii) "මිලේනියම් චැලේන්ජ් කෝපරේෂන්" මඟින් ආධාර ලබා ගැනීමේ ව්‍යාපෘතිය

(ix) වෙළඳ ප්‍රතිපත්තිය

(x) සංචාරණය - ප්‍රමාණය ඉක්මවා යාම සම්බන්ධ වාර්තාව

(xi) සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ පර්යේෂණ වාර්තාව

(xii) මාර්ගගත තොරතුරු ද්වාරය - ගැමි පොළ/සතිපොළ සිතියම්ගත කිරීම

(xiii) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන " සූර්ය කිරණ බලශක්ති සංග්‍රාමය" සඳහා මෘදු ණය වැඩසටහනක් සම්පාදනය

(xiv) ක්ෂුද්‍ර මූල්‍යකරණය

(xv) සුරක්ෂිතතා ජාල විශ්ලේෂණය

## 2.12. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අධ්‍යයන කමිටුව

ශ්‍රී ලංකා රජය විසින්, ඉදිරි තෙවසර තුළදී පාසල් අධ්‍යාපන ක්‍රමවේදය පරිවර්තනයකට භාජනය කරලීම සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් අධ්‍යයනය කරමින් සිටී. අධ්‍යාපනය, ජාතික ආර්ථික සංවර්ධනයෙහි ප්‍රමුඛතම සාධකයක් බවට පත් කරමින් ගෝලීය අධ්‍යාපන ප්‍රමිතීන්ට ළඟාවීම මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයෙහි අරමුණ වේ.

මෙහිදී පහත දැක්වෙන ප්‍රධාන ප්‍රතිසංස්කරණ කෙරෙහි අවධානය යොමු කෙරේ.

**13 වසරක පාසල් අධ්‍යාපනය සහතිකවීම**

- තම කුසලතාවයන්, අපේක්ෂාවන් සපුරාලන අධ්‍යාපන ක්‍රමවේදයක් සහිත වූ අධ්‍යයන පරිසරයක, 13 වසරක අධ්‍යාපනය සම්පූර්ණ කරලීම සඳහා සමස්ත ශිෂ්‍ය පරපුරට අවස්ථාව සලසා දීම

- ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපන, තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය ඵලදායී ලෙස ලබා දී වෘත්තීය ලෝකය සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමට අවශ්‍ය පදනම සකස් කර දීම

- රටේ ආර්ථික වර්ධනයට ඍජු දායකත්වය ලබාගත හැකිසේ තම දක්ෂතාවයන් හා නිර්මාණාත්මක හැකියාවන් තුළින් උසස් පෞරුෂත්වයක් ගොඩනගා ගැනීමට අවස්ථාව සැලසීම

**පාඨශාලා මණ්ඩල පිහිටුවීම**

- සම්පත් භාවිතයෙහි සහ අධ්‍යාපන වැඩසටහන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමෙහි ලා සැලසුම් හා තීරණ, සේවා සම්පාදන මට්ටමේදීම ගැනීමට හැකිවන පරිදි, මූලික කළමනාකරණ ඒකකයන් ලෙස පාසැල් සවිබල ගැන්වීම

- ප්‍රජාතාන්ත්‍රික සහභාගිත්ව මූලධර්මයන් වර්ධනය කර ගනිමින් හා ප්‍රාදේශීය පරිසරයෙහි අනන්‍යතාවය හඳුනා ගනිමින්, තීරණ ගැනීමේ ක්‍රියාදාමය සඳහා ගුරුභවතුන්ගේ, දෙමාපියන්ගේ හා ප්‍රජා නියෝජිතයින්ගේ සහභාගිත්වය වැඩි කර ගැනීම

- ප්‍රාදේශීය ප්‍රජා සහයෝගය ලබා ගැනීමට සහ අවශ්‍ය සම්පත් උපයා ගැනීමට මෙන්ම, සහතික වූ 13 වසරක අධ්‍යාපන අරමුණු වර්ධනය කර ගැනීමට අවශ්‍ය සහාය ලබා දීමට පාසල් විසින් අඛණ්ඩව කටයුතු කරන බවට සහතික වීම

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරීක්ෂණ මණ්ඩලය පිහිටුවීම**

- සැලසුම්ගත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ තක්සේරු කිරීම්, ඇගයීම් හා තීරණ ගැනීමෙහි නියැලෙමින්, අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස, පාසැල් කාර්ය සාධන සමාලෝචනය සිදු කිරීම

- විශේෂඥ දැනුම සම්පාදනය සහ කළමනාකරණයට බාධා පමුණුවන ගැටලු නිරාකරණය කරලීම වැනි මාර්ගයන් ඔස්සේ පාසැල් වලට සහාය වීම

- ස්වකීය දරුවන්ගේ කාර්ය සාධනය සම්බන්ධයෙන් දෙමාපියන් දැනුවත් කිරීම සහ පාසැල් කාර්ය සාධනය සම්බන්ධයෙන් ප්‍රජා පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම

## 2.13. ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය

රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේදී, යහපාලන මූලධර්මයන් ප්‍රශස්ත අන්දමින් ක්‍රියාත්මක කරමින් පාරදෘශ්‍යභාවය තහවුරු කෙරෙන අයුරින්, අංග සම්පූර්ණ, විශ්වසනීය සහ නිවැරදි තොරතුරු ජනතාව වෙත ගලායෑමට සැලැස්වීම රජයේ ප්‍රමුඛතම වගකීම වන්නේය.

අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත බල ගැන්වීම, රාජ්‍ය ව්‍යුහය ඇතුළත ක්‍රමෝපායිකව තොරතුරු ගලා යෑම සහතිකවීම සහ ජනතා සහභාගිත්වය සහ ජනතා අදහස් ලබා ගැනීම යන කරුණු විෂය කරගනිමින් ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත.

මෙම මධ්‍යස්ථානය මඟින් තොරතුරු විශ්ලේෂණ කටයුතු, මාධ්‍ය මෙහෙයුම්, මාධ්‍ය ජාල අතර තොරතුරු සම්බන්ධීකරණය, ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජනතා අදහස් ලබා ගැනීම, රාජ්‍ය නිල තොරතුරු ප්‍රකාශක ලෙස කටයුතු කිරීම, විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වෙත රජයේ නිල තොරතුරු ලබාදීම සහ තොරතුරු සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යවරයා සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගෙන් සමන්විත කමිටුවක් යටතේ ස්ථාපනය කරන ලද ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය, ජනාධිපති ලේකම් හා අග්‍රාමාත්‍ය ලේකම් විසින් නම් කරන ලද නිලධාරීන් දෙදෙනෙකුගෙන් සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් සමන්විත ත්‍රෛපාර්ශ්වීය පාලන සභාවක් යටතේ ක්‍රියාත්මක වේ. මෙම මාධ්‍ය මධ්‍යස්ථානයෙහි සභාපති වශයෙන් ඉම්තියාස් බාකීර් මාකර් මහතා කටයුතු කරන අතර ප්‍රධාන විධායක නිලධාරියෙකු ඇතුළු පුහුණු කාර්ය මණ්ඩලයක් මෙහි සේවය කරති.

අග්‍රාමාත්‍ය කාර්යාලයට අයත්, විසුම්පාය කාර්යාල පරිශ්‍රයෙහි ස්ථාපිත මෙම මධ්‍යස්ථානයේ ප්‍රවෘත්ති නිලධාරී, වෙබ් අඩවි ලේඛක සහ මාධ්‍ය විමර්ශන සහකාර යන තනතුරුවලට අදාළ නවක නිලධාරීන් මෙහෙයුම් කටයුතුවල යෙදෙන අතර, මෙහෙයුම් කටයුතු සුපරීක්ෂණය සඳහා අධ්‍යක්ෂකවරුන් තිදෙනෙක් මාධ්‍ය සුපරීක්ෂණ, තොරතුරු ජාල, මාධ්‍ය නිරීක්ෂණ සහ පර්යේෂණ යන ක්ෂේත්‍ර යටතේ පත් කර ඇත. එසේම බඳවාගත් නිලධාරීන් සඳහා ඔවුන්ගේ ක්ෂේත්‍රවලට අදාළව දෙසතියක විශේෂඥ පුහුණුවක් ලබා දී දිවා රාත්‍රී වැඩ මුර යටතේ රාජකාරියෙහි යෙදවීමට කටයුතු කර ඇත.

අග්‍රාමාත්‍ය කාර්යාලයෙහි වෙනම ව්‍යාපෘතියක් ලෙස මෙම මධ්‍යස්ථානයෙහි මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් වෙන් කර දෙනු ලැබේ.

විද්‍යුත් මුද්‍රිත සහ සමාජ මාධ්‍ය නිරීක්ෂණ කාර්ය ක්‍රමවත්ව ආරම්භකර ඇති අතර, අමාත්‍යාංශ හා රජයේ විවිධ ආයතන වල අවශ්‍යතා අනුව විවිධ නිරීක්ෂණ සහ සමීක්ෂණ පදනම් කරගත් වාර්තා සකස් කිරීම සහ කාලීන සිදුවීම් අලලා වාර්තා සකස් කිරීම සිදු කරයි.

# 03. ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය

## 3.1. අග්‍රාමාත්‍යවරයාගේ නිල විදේශ සංචාර

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විදේශීය රටවල් හා ජාත්‍යන්තර සංවිධාන සමඟ පවතින ආර්ථික, සාමාජීය, දේශපාලනික, පාරිසරික, ආගමික හා සංස්කෘතික ආදී සෑම ක්ෂේත්‍රයක් පිළිබඳවම පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාවන් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණෙන් 2016 වර්ෂයේ දී පහත සඳහන් නිල විදේශ සංචාරවලට සහභාගී වූ අතර එමඟින්, ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ රැසක් ළඟාකර ගැනීමට හැකි විය.

### 3.1.1. ස්විට්සර්ලන්ත නිල සංචාරය - ලෝක ආර්ථික සමුළුව 2016

ශ්‍රී ලංකාවට ප්‍රථම වරට ලැබුණු ආරාධනය පිළිගනිමින්, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2016 ජනවාරි මස 19 දින සිට 24 දින දක්වා ස්විට්සර්ලන්තයේ ඩාවොස් නුවර පැවති වාර්ෂික ලෝක ආර්ථික සමුළුව සඳහා සහභාගි විය.

මෙහිදී අග්‍රාමාත්‍යවරයා විසින් මෙම සමුළුව සඳහා සහභාගී වූ ජනාධිපතිවරුන්, අග්‍රාමාත්‍යවරුන්, අමාත්‍යවරුන්, විවිධ ආර්ථික සංවිධානයන්හි සභාපතිවරුන්, නියෝජිතයින් හා වෙළඳ ප්‍රජාව හමුවී සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර, එමඟින් වර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකා ආර්ථිකය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අවශ්‍ය සහාය ලබාදීමට එකඟ විය.

ඒ අනුව;

1) ස්වීඩන් අග්‍රාමාත්‍ය ගරු ස්ටෙෆාන් ලොෆ්වන් මැතිතුමා සමඟ පැවැති ද්විපාර්ශ්වීය සාකච්ඡාවට අනුව, ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ උන්නතිය සඳහා සහයෝගය ලබාදීම

2) ශ්‍රී ලංකාව හා නෙදර්ලන්තය අතර පවතින දීර්ඝ ඓතිහාසික සබඳතා තවදුරටත් වර්ධනය කරගැනීමේ අරමුණෙන්, ගාලු වරායට අමතරව ශ්‍රී ලංකාවේ ඇති ඕලන්ද වරාය 8 ක් සංවර්ධනය කිරීම

3) නෙදර්ලන්තයේ, පිලිප්ස් ලයිටින් සොලියුෂන්ස් සමාගමේ ගෝලීය ප්‍රධාන විධායක නිලධාරි, එරික් රොන්ඩොලට් මහතා සමඟ පැවති සාකච්ඡාවට අනුව, බලශක්ති කාර්යක්ෂමතාවය ඇති කිරීම, සූර්ය කිරණ බලශක්ති ක්‍රමවේද භාවිතය, දුෂ්කර පළාත් සඳහා භූ-අනුරූපී තාක්ෂණය යොදා ගැනීම ආදී ක්ෂේත්‍ර සඳහා සහයෝගය ලබා දීම

4) මැකන්සි සහ සමාගමේ ආසියානු සභාපති, කෙවින් ස්නීඩර් මහතා සමඟ පැවැති සාකච්ඡාවට අනුව රාජ්‍ය අංශයේ සේවා ප්‍රසාරණය වැඩි දියුණු කිරීම හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූරණය කිරීම









### 3.1.2. දකුණු කොරියානු නිල සංචාරය - රොටරි ජාත්‍යන්තර සමුළුව

“තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් සංවර්ධිත හා සංස්කෘතික වශයෙන් ඓතිහාසිකව බැඳුණු ජාතියක් ලෙස කොරියාවේ වර්තමාන සාර්ථකත්වය සහ වර්ධනය” යන්න මෙවර රොටරි සමුළුවේ ප්‍රධාන තේමාව වූ අතර එම සාර්ථකත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීම මූලික අරමුණ කර ගනිමින් 2016 මැයි මස 29 වන දින සිට ජූනි 01 වන දින දක්වා දකුණු කොරියාවේ සෝල් නගරයේ දී පැවති 107 වන රොටරි ජාත්‍යන්තර සමුළුව සඳහා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහභාගී විය.

මෙම සමුළුව සඳහා රටවල් 160 ක් නියෝජනය කරමින් රොටරි සංගමයේ සමාජිකයින් 50,000කට අධික පිරිසක් සහභාගි වූ අතර අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් මූඛ්‍ය දේශනය පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා විශේෂ ආරාධිතයන් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්, අතිගරු බැන් කී මූන් මැතිතුමා සහ දකුණු කොරියානු අග්‍රාමාත්‍ය, ගරු හ්වං ක්යෝ ආන් මැතිතුමා සහභාගි වූ අතර, එහිදී ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික, දේශපාලන, අධ්‍යාපනික හා තාක්ෂණික අංශයන්හි වර්තමාන තත්ත්වය හා අනාගත අපේක්ෂාවන් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට හැකිවීම සුවිශේෂ අවස්ථාවක් ලෙස දැක්විය හැක.






### 3.1.3. සිංගප්පූරු නිල සංචාරය

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රධාන දූත පිරිස 2016 ජූලි මස 17 වන දින සිට 19 වන දින දක්වා සිංගප්පූරුවේ නිල සංචාරයක නිරත විය. මෙම සංචාරයේ දී අග්‍රාමාත්‍යවරයා, සිංගප්පූරු අග්‍රාමාත්‍ය ගරු ලී ලුන් මැතිතුමා, සන්නිවේදන, තොරතුරු සහ අධ්‍යාපන අමාත්‍යතුමා සහ දෙරටෙහි මහ කොමසාරිස්වරු ඇතුළු ප්‍රධාන නිලධාරීන් රැසක් සමඟ පැවති සාකච්ඡාවන්හි දී ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පදනම යොදන ලදී.

මෙම සංචාරය මඟින් දෙරට අතර ද්විපාර්ශ්වික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමට හැකිවන පරිදි පහත සඳහන් කාර්යයන් සඳහා සහාය ලබාදීමට එහිදී එකඟ වන ලදී.

1) සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලය සමඟ සහසම්බන්ධ වී ශ්‍රී ලංකාවේ පරිපාලන සේවයේ තත්ත්වය ඉහළ නැංවීම
2) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හා සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලය අතර දැනට ක්‍රියාත්මක වන පුහුණු වැඩසටහන් තවදුරටත් පුළුල් කරලීම සහ ශ්‍රී ලංකා විනිශ්චයකරුවන්ගේ ආයතනය හා සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලය අතර අන්තර් සබඳතා පුළුල් කරලීම
3) ශ්‍රී ලංකාවේ බේරේ වැව හා ඒ ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කරලීම සඳහා සිංගප්පූරු නදිය ආශ්‍රිතව සිදුකළ සංවර්ධන කාර්යයන් ආදර්ශයට ගැනීම
4) සිංගප්පූරුවේ ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම
5) නව වෙළඳ ගිවිසුම් සිංගප්පූරු රජය සමඟ ඇති කර ගැනීම
6) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය හා තාක්ෂණික අංශයන් හි සංවර්ධනය ඇති කරලීම සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

   - විධිමත් පාසැල් අධ්‍යාපනය අවසන් කළ ශ්‍රී ලාංකීය තරුණයින්ගේ අනෙකුත් කුසලතා වර්ධනය කිරීමේ අරමුණෙන් 2016 අගෝස්තු මස සිට පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා, සිංගප්පූරුවේ, තොරතුරු තාක්ෂණ අධ්‍යාපනික සේවා සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන සහ අභ්‍යාස ක්ෂේත්‍රයෙහි සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකට එළඹීම
   - ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ හා සත්කාරක සේවා අංශ සඳහා අභ්‍යාස ආයතන ස්ථාපිත කිරීම සඳහා සිංගප්පූරුවේ සහාය ලබා ගැනීම

- වයඹ පළාත් මහා නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සිංගප්පූරුවේ ජාත්‍යන්තර ව්‍යාපාර මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම

- ශ්‍රී ලාංකික කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා නායකත්ව පුහුණු වැඩ සටහන් දෙකක් පැවැත්වීම

- රාජ්‍ය සේවා පුහුණු වැඩසටහන් සඳහා සිංගප්පූරු සහයෝගීතාව ලබා ගැනීම සහ ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ සේවා ප්‍රමිතිය හා සේවා ප්‍රසාරණය ඉහළ නැංවීම සඳහා සිංගප්පූරුවේ සිවිල් සේවා විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම

- දෙරට අතර සංස්කෘතික හුවමාරු ක්‍රියාදාමයන් පහසුකරණය සඳහා සිංගප්පූරුවේ, සංස්කෘතික, ප්‍රජා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ සංස්කෘතික ක්ෂේත්‍රයෙහි සහයෝගීතාවය මත අවබෝධතා ගිවිසුම






### 3.1.4. ඉන්දුනීසියානු නිල සංචාරය - 12 වන ලෝක ඉස්ලාමීය ආර්ථික සමුළුව

"කලාපීය සහයෝගීතාවය වෙනුවෙන් පෞද්ගලික අංශයේ කාර්ය භාරය" නැමැති තේමාව යටතේ මෙවර ඉන්දුනීසියාවේ ජකාර්තා නුවර පැවැති 12 වන ලෝක ඉස්ලාමීය ආර්ථික සමුළුව සඳහා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2016 ජූලි මස 31 දින සිට අගෝස්තු මස 03 වන දින දක්වා ඉන්දුනීසියානු නිල සංචාරයක නිරත විය.

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා, මෙම සමුළුවට සහභාගී වූ ඉන්දුනීසියාවේ ජනාධිපති, අතිගරු ජොකෝ විදොදෝ, මුදල් අමාත්‍ය ගරු ශ්‍රී මුල්යානි ඉන්ද්‍රවතී සහ සමුද්‍ර කටයුතු අමාත්‍ය, ගරු ලුහුත් බින්සාර් ජන්ජයිතාන් යන මහත්ම මහත්මීන් හමුවී ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී.

එහිදී, ශ්‍රී ලංකා රජය දැනට සිදු කරමින් පවතින සීඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමයට ඉවහල්වන කරුණු රාශියක් සාකච්ඡා කරන ලද අතර, ඉන්දුනීසියා සහ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩල අතර සහයෝගීතාව ඇති කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම සහ ඉන්දුනීසියාවේ ආයෝජකයින්ට මෙන්ම ශ්‍රී ලංකාවේ ආයෝජකයින්ට ආයෝජන අවස්ථා පුළුල් කරලීමටත්, මේ වන විටත් ඉන්දුනීසියාවේ තේ ඇතුළු වැවිලි ක්ෂේත්‍රයෙහි ශ්‍රී ලංකා ආයෝජන ඇති බැවින් ඒවා තවදුරටත් ප්‍රවර්ධනය කිරීමටත් එකඟ විය.






### 3.1.5. චීන නිල සංචාරය

2016 අගෝස්තු මස 13 වන දින සිට 17 වන දින දක්වා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු දූත පිරිස චීනයේ නිල සංචාරයක නිරත විය. එහිදී, අග්‍රාමාත්‍යවරයා ඇතුළු දූත පිරිස චීන රජයට අයත් කර්මාන්ත පුර, බහාලුම් පර්යන්ත, තාක්ෂණික උද්‍යාන, මූල්‍ය මධ්‍යස්ථාන හා නිර්මාණාත්මක නිෂ්පාදන ආයතන ආදී ආර්ථික සංවර්ධනය සඳහා පාදක වන කේන්ද්‍රීය ස්ථාන ගණනාවක් නිරීක්ෂණය කරන ලදී.

මෙහිදී, ශ්‍රී ලංකාව හා චීනය අතර පවතින ද්විපාර්ශ්වික සම්බන්ධතා තව දුරටත් ශක්තිමත් කරගත හැකි ආකාරය පිළිබඳව චීන රජයේ නිලධාරීන් හා මහා පරිමාණ ව්‍යවසායකයින් සමඟ අදහස් හුවමාරු කර ගන්නා ලදී.

එමෙන්ම, මෙම සංචාරයේ දී ශ්‍රී ලංකාවට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන පරිදි පහත සඳහන් කාර්යයන් ඉටුකර දීමට සහය ලබා දීම සඳහා දෙරට අතර අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීමට එකඟ විය.

1) වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය, හම්බන්තොට වරාය, මහා නගර ව්‍යාපෘතිය සහ කර්මාන්ත සංවර්ධනය
2) වකුගඩු රෝගය පරීක්ෂා කිරීමේ ජංගම වාහන ව්‍යාපෘතිය
3) ආරක්ෂාකාරී ජල සම්පාදන තාක්ෂණය පිළිබඳ ඒකාබද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම
4) වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සහයෝගීතාවය ශක්තිමත් කිරීම සඳහා ඉදිරි පස්වසර තුළදී පුහුණු අවස්ථා 2000 ක් ශ්‍රී ලංකාවට ලබාදීම
5) අවබෝධතා ගිවිසුම්
    - චීනය හා ශ්‍රී ලංකාව අතර උදර්පණ ගිවිසුම (Treaty of Extradition)
    - ආයෝජන, ආර්ථික හා තාක්ෂණ සහයෝගිතාව පුළුල්ව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම
    - දක්ෂිණ අධිවේගී මාර්ගය දිගුවේ ඉදිකිරීම් කටයුතු සඳහා පක්ෂපාතී ණය ආධාර ගිවිසුම
    - චීන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර සහයෝගිතාව මත අවබෝධතා ගිවිසුම
    - චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම සහ ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනම අතර අවබෝධතා ගිවිසුම




DEVELOPING HAMBANTOTA INTO THE NEXT SHEKOU
August 16, 2016
Shenzhen, China


欢迎斯里兰卡拉尼尔·维克拉马辛哈总理阁下一行访问中新示范项目管理局
A Warm Welcome to the Delegation Led by Hon. Ranil Wickremesinghe, Prime Minister of Sri Lanka to CCIB

### 3.1.6. සිංගප්පූරු නිල සංචාරය - ඉන්දීය සාගර සමුළුව 2016

ඉන්දීය පදනම විසින් සංවිධානය කළ, ඉන්දීය සාගර සමුළුවේ සමාරම්භක දේශනය පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා වෙත කරන ලද ආරාධනය පිළිගනිමින්, ඉන්දීය සාගර කලාපයේ ප්‍රධානතම රාජ්‍යයන්හි සහභාගීත්වයෙන් 2016 සැප්තැම්බර් මස 01 වන හා 02 වන දිනයන්හි දී සිංගප්පූරුවේ ෂැන්ග්‍රිලා හෝටලයේ පැවැති ඉන්දීය සාගර සමුළුවේ සමාරම්භක දේශනය, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් පවත්වන ලදී.

මාලදිවයිනේ හිටපු ජනාධිපති අතිගරු මයුම් අබ්දුල් ගයුම් මැතිතුමා, මැලේසියානු නියෝජ්‍ය අග්‍රාමාත්‍ය ගරු දාතෝ සේරි ආචාර්ය අහමඩ් සහිඩ් හමිඩි මැතිතුමා ඇතුළු දේශපාලනඥයින්, විද්වතුන් හා උසස් නිලධාරීන් විශාල පිරිසක් මෙම සමුළුවට සහභාගී විය.

මෙම සමුළුව සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, බංග්ලාදේශයේ ජාත්‍යන්තර උපාය මාර්ග ආයතනය සහ සිංගප්පූරුවේ ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ එස් රාජරත්නම් ආයතනය නියෝජනය කෙරිණි. ඉන්දීය සාගර කලාපයට බලපාන ආරක්ෂක, ආර්ථික, සංස්කෘතික හා පාරිසරික ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම මෙම සමුළුව පැවැත්වීමේ ප්‍රධාන අරමුණ විය.

මෙම නිල සංචාරයේ දී අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති, උතුරු සහ නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කරවීමේ කටයුතු, දකුණු ඉන්දියානු ප්‍රාන්ත රාජ්‍යයන් සහ ශ්‍රී ලංකාව අතර සමීපස්ථ සහයෝගිතාවයක් ගොඩනගා ගැනීමේ හැකියාව පිළිබඳව මෙන්ම මිලේනියම් සංවර්ධන සහයෝගිතා සංවිධානය මඟින් ලබා ගැනීමට අපේක්ෂිත ආධාර පිළිබඳව ද සමුළුවට සහභාගී වූ විදේශ නියෝජිතයින් සමඟ සාකච්ඡා කරන ලදී.






### 3.1.7. නවසීලන්ත නිල සංචාරය

නවසීලන්ත අග්‍රාමාත්‍යතුමන් වෙතින් ලද ආරාධනයක් අනුව ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා 2016 ඔක්තෝබර් මස 01 වන දින සිට 03 වන දින දක්වා නවසීලන්තයේ නිල සංචාරයක යෙදුණි. එම සංචාරය අතරතුර ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට නවසීලන්ත පාර්ලිමේන්තුව ඇමතීමටත්, නවසීලන්ත අගමැති ගරු ජෝන් කී මැතිතුමා, මුදල්, ආර්ථික සංවර්ධන හා වෙළඳ ආදී ප්‍රධාන අංශයන් ට අදාළ නවසීලන්ත රජයේ අමාත්‍යවරුන් හා ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික ආයතන නියෝජිතයන් රැසක් සමඟ සාකච්ඡා පැවැත්වීමටත් අවස්ථාව සැලසින.

දෙරටේ අග්‍රාමාත්‍යවරුන් අතර පැවති සාකච්ඡා අතරතුර, දෙරට තානාපති කාර්යාලයන් පිහිටුවීමටත්, එමඟින් රටවල් අතර සහයෝගීතාවය වර්ධනය කිරීමටත් තීරණය විය. මිශ්‍ර නියෝජනයක් සහිත නවසීලන්ත පාර්ලිමේන්තු ක්‍රමය සහ වර්තමානයේ නවසීලන්තය තුළ ක්‍රියාත්මක මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් ද දෙරටේ අග්‍රාමාත්‍යවරුන් සාකච්ඡා කරන ලදී.

නවසීලන්තය හා ශ්‍රී ලංකාව අතර පවත්නා සහයෝගීතාව වර්ධනය කිරීම අරමුණු කරගනිමින්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත/ආර්ථික අංශයන් දියුණු කිරීමට නවසීලන්ත රජය විසින් සහයෝගය ලබාදීමට එකඟ විය. ඒවා නම්;

1) කිරි නිෂ්පාදන කර්මාන්තය සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම
2) ධීවර කටයුතු කළමනාකරණය සම්බන්ධ උපක්‍රම භාවිතය
3) භාණ්ඩාගාරය ප්‍රතිව්‍යුහගත කිරීම, ආර්ථික, මුදල් හා රාජ්‍ය ව්‍යවසාය යන අංශයන් ප්‍රතිසංස්කරණය
4) කෘෂිකාර්මික ක්ෂේත්‍ර දියුණු කිරීම සඳහා උසස් තාක්ෂණය සහ පුහුණුව ලබාදීම




### 3.1.8. ඉන්දීය නිල සංචාරය

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ දූත කණ්ඩායම 2016 ඔක්තෝබර් මස 04 වන දින සිට 06 වන දින දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර නිල සංචාරයක නිරත විය. මෙම නිල සංචාරය අතරතුර අග්‍රාමාත්‍යතුමන් ඉන්දීය ජනාධිපති, අගමැති ඇතුළු ඉන්දීය රජයේ අමාත්‍යවරු කිහිපදෙනෙකු සමඟ නිල වශයෙන් සාකච්ඡා පවත්වන ලදී.

එම සාකච්ඡාවන්හී දී ප්‍රධාන වශයෙන් ඉන්දු-ලංකා ධීවර ගැටළුව, ඉන්දියානු සහයෝගීතා නිවාස ව්‍යාපෘතිය, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම (ECTA), උතුරේ මාර්ග සංවර්ධනය, බල ශක්ති උත්පාදනය හා ත්‍රිකුණාමලය තෙල් පිරිපහදුව සම්බන්ධව අවධානය යොමු කෙරිණි.

මෙම සංචාරය තුළදී, ඉන්දීය ආයෝජකයන් ශ්‍රී ලංකාවේ ආයෝජනය සඳහා දිරි ගැන්වීමටත්, යාපනය-කොළඹ, මන්නාරම-ත්‍රිකුණාමලය හා ත්‍රිකුණාමලය-දඹුල්ල යන මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා සහය ලබාදීමටත් ඉන්දීය රජය එකඟ විය.





### 3.1.9. බෙල්ජියම් නිල සංචාරය

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2016 ඔක්තෝබර් මස 16 වන දින සිට 21 වන දින දක්වා බෙල්ජියමේ නිල සංචාරයක නිරත විය. එහිදී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා බෙල්ජියම් ජනාධිපති ගරු චාර්ල්ස් මිචෙල් මැතිතුමා, ලෝරන්ස් කුමරා සහ යුරෝපා පාර්ලිමේන්තුවේ ප්‍රධානීන් මුණගැසුන අතර, යුරෝපා සංගමයේ ප්‍රධාන නිලධාරීන් සමඟ ද සාකච්ඡා පවත්වන ලදී.

මෙම නිල සංචාරයේ මූලික අරමුණ GSP+ සහනය නැවත ලබා ගැනීම සඳහා අදාළ අංශ සමඟ සාකච්ඡා කිරීම වූ අතර, එහි දී අග්‍රාමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය දියුණු කිරීම සඳහා වන නව සැළසුම් විස්තර කරන ලදී. යුරෝපා සංගමයේ ප්‍රධාන නිලධාරීන් විසින් GSP+ සහනය නැවත ලබා ගැනීම සම්බන්ධව කරන ලද ඉල්ලීමට යහපත් ප්‍රතිචාර දක්වන ලදී.





## 3.2. රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ විදේශ නියෝජිතයන් සමග පැවති සාකච්ඡා

| අංක | දිනය | රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ විදේශ නියෝජිතයන් |
|---|---|---|
| 01 | 2016.01.04 | එක්සත් රාජධානියේ හිටපු අග්‍රාමාත්‍ය ගරු ටෝනි බ්ලෙයාර් මැතිතුමා |
| 02 | 2016.01.05 | පකිස්තානු අග්‍රාමාත්‍ය අතිගරු නවාස් ෂෙරීෆ් මැතිතුමා |
| 03 | 2016.01.05 | ඇමරිකා එක්සත් ජනපද ආයෝජක ජෝර්ජ් සොරොස් මහතා |
| 04 | 2016.01.07 | නෝර්වීජියානු විදේශ අමාත්‍ය ගරු බර්ජ් බෙන්ඩ්ෙ මැතිතුමා |
| 05 | 2016.01.07 | හාවර්ඩ් සරසවියේ, ජෝන් එෆ් කෙනෙඩි ශාස්ත්‍රාලයෙහි ආර්ථික සංවර්ධන ව්‍යවහාර පිළිබඳ මහාචාර්ය රිකාඩෝ හුස්මන් මහතා සහ ඇමරිකානු ආර්ථික විද්‍යාඥ කොළම්බියා සරසවියේ මහාචාර්ය ජෝෂප් ස්ටිග්ලිෂ් මහතා |
| 06 | 2016.01.12 | ඉන්දියානු විදේශ කටයුතු ලේකම්, අතිගරු ආචාර්ය එස් ජේෂන්කර් මැතිතුමා |
| 07 | 2016.01.14 | එක්සත් රාජධානියේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය, ගරු හියුගෝ ස්වයර් මැතිතුමා |
| 08 | 2016.01.18 | කොරියානු එක්ෂිම් බැංකු අධිපති, ආචාර්ය ලී ඩුක්-හුන් මහතා |
| 09 | 2016.01.28 | ඔස්ට්‍රේලියානු දේශපාලන ක්‍රමෝපාචාර්ය, ශ්‍රීමත් ලින්ටන් කොස්බි මහතා |
| 10 | 2016.02.05 | විදේශ කටයුතු සහ විදේශයන්හි ඉන්දියානු කටයුතු භාර අමාත්‍ය, ගරු ශ්‍රීමති සුෂ්මා ස්වරාජ් මැතිණිය |
| 11 | 2016.02.05 | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත පිරිස |
| 12 | 2016.02.08 | ශ්‍රී ලංකා මිත්‍ර සංසදයේ සභාපති, ගරු ජෙෆ්රි වැන්-ඕර්ඩන් මැතිතුමා සහ මෝටෙන් මෙසර්ෂ්මිට් මහතා |
| 13 | 2016.02.09 | එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් අතිගරු සයිඩ් රාඩ් අල් හුසේන් මැතිතුමා |
| 14 | 2016.02.23 | ආසියානු සංවර්ධන බැංකු සභාපති, ටකහිකෝ නකායෝ මහතා |
| 15 | 2016.02.24 | නවසීලන්ත අග්‍රාමාත්‍ය, ගරු ජෝන් කී මැතිතුමා |
| 16 | 2016.02.25 | ඉරාන ඉස්ලාමීය ජනරජයේ බලශක්ති අමාත්‍ය, ගරු චිච්යන් හමීඩ් මැතිතුමා |
| 17 | 2016.03.01 | ඇමරිකා එක්සත් ජනපද උප ලේකම්, පැට්‍රික් එෆ්. කෙනඩි මහතා |
| 18 | 2016.03.08 | පකිස්තානු ජනාධිපති, අතිගරු මම්නූන් හුසේන් මැතිතුමා |
| 19 | 2016.03.09 | සහස්‍ර අභියෝගතා සංස්ථා උප සභාපති, බෙත් ට්‍රිටෙර් මහතා |
| 20 | 2016.03.10 | තායිලන්ත නියෝජ්‍ය අග්‍රාමාත්‍ය, අතිගරු සොම්කිඩ් ජටුශ්‍රීපිටක් මැතිතුමා |
| 21 | 2016.03.16 | ජාත්‍යන්තර සහයෝගිතා සහ සංවර්ධන යුරෝපා සංගම් කොමසාරිස් නෙවාන් මිමිකා මහතා සහ දූත පිරිස |
| 22 | .201604.22 | සාර්ක් මහ ලේකම් අතිගරු අර්ජුන් බී තාපා මැතිතුමා |

| අංක | දිනය | රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ විදේශ නියෝජිතයන් |
|---|---|---|
| 23 | 2016.04.25 | ස්වීඩන්, විදේශ කටයුතු අමාත්‍ය, අතිගරු මාර්ගොට් වොල්ස්ට්‍රම් මැතිණිය |
| 24 | 2016.04.27 | තායිලන්ත රාජ්‍ය ආරක්ෂක හමුදා ප්‍රධානී, ජෙනරාල් සෝමායි කඕට්රා මහතා |
| 25 | 2016.05.04 | මාලදිවයින් විදේශ කටයුතු අමාත්‍ය, අතිගරු දුන්යා මවුමූන් මැතිණිය |
| 26 | 2016.05.16 | ජර්මන්, ආර්ථික කටයුතු සහ බලශක්ති පාර්ලිමේන්තු රාජ්‍ය ලේකම්, උවේ බෙක්මේයර් මහතා |
| 27 | 2016.05.18 | ජපාන අග්‍රාමාත්‍ය විශේෂ උපදේශක, හිරෝතෝ ඉසුමි මහතා |
| 28 | 2016.05.18 | එක්සත් ජනපද හිටපු නියෝජ්‍ය රාජ්‍ය ලේකම්, ගරු රිචර්ඩ් ආර්මිටේජ් මැතිතුමා |
| 29 | 2016.05.19 | ලෝක බැංකු විධායක අධ්‍යක්ෂ මණ්ඩල චාරිකාව |
| 30 | 2016.05.27 | මැලේසියානු විශේෂ රාජ්‍ය නියෝජිත, ගරු ටූන් මූසා හිතාම් මැතිතුමා |
| 31 | 2016.06.06 | බ්‍රිතාන්‍ය රාජ්‍ය තාන්ත්‍රික සේවා ප්‍රධානී, ශ්‍රීමත් සයිමන් මැක්ඩොනල්ඩ් මැතිතුමා |
| 32 | 2016.06.15 | තුර්කි විදේශ කටයුතු අමාත්‍ය, ගරු මෙවුලට් කවුසෝග්ලු මැතිතුමා |
| 33 | 2016.07.09 | චීන විදේශ කටයුතු අමාත්‍ය, ගරු වැංයි මැතිතුමා |
| 34 | 2016.07.12 | ඉරාන ඉස්ලාමීය ජනරජ නිර්මාතෘවරයාගේ මුණුබුරු සහ සුපතළ ඉස්ලාමීය පූජක, අතිගරු අයතොල්ලා සෙයිඩ් හසන් කොමේයිනි පූජකතුමා |
| 35 | 2017.07.03 | ඇමරිකානු එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම්, නිෂා බිස්වාල් මැතිණිය |
| 36 | 2017.07.21 | ලෝක ආර්ථික සංසද නිලධාරී, ආචාර්ය පිලිප් රොස්ලර් මහතා සහ විරාජ් මේතා මහතා |
| 37 | 206.07.22 | මැලේසියානු නියෝජ්‍ය අග්‍රාමාත්‍ය, ගරු අහ්මඩ් ෂහීඩ් බින් හමීඩි මැතිතුමා |
| 38 | 2016.07.27 | ජපාන, ජාත්‍යන්තර කටයුතු උප අග්‍රාමාත්‍ය, ගරු හිරෝෆියුමි කටාසේ මැතිතුමා |
| 39 | 2016.07.28 | කැනඩා විදේශ කටයුතු අමාත්‍ය, ගරු ස්ටෙෆාන් ඩියෝන් මැතිතුමා |
| 40 | 2016.08.08 | පකිස්තානු ගුවන් හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානී, එයා චීෆ් මාෂල් සොහේල් අමාන් මහතා |
| 41 | 2016.08.12 | නෝර්වේ අග්‍රාමාත්‍ය, ගරු අර්නා සොල්බර්ග් මැතිණිය |
| 42 | 2016.08.31 | එක්සත් ජාතීන්ගේ මහ ලේකම්, අතිගරු බැන් කී මූන් මැතිතුමා |
| 43 | 2016.09.26 | ඉන්දියානු වාණිජ හා කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය, ගරු ශ්‍රීමති නිර්මලා සීතාරාමන් මැතිණිය |
| 44 | 2016.10.07 | ස්විට්සර්ලන්ත ජාතික සභාවේ කථානායක ගරු ක්‍රිස්ටා මාර්ක්වල්ඩර් මැතිනිය |
| 45 | 2016.10.10 | ජපාන අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ උපදේශක හිරෝතෝ ඉසුමි මහතා |
| 46 | 2016.10.12 | එක්සත් ජාතීන්ගේ උප මහ ලේකම් සහ ආසියා ශාන්තිකර කලාපීය ආර්ථික සහ සමාජීය කටයුතු පිළිබඳ කාරක සභාවේ (ESCAP) විධායක ලේකම් ආචාර්ය ශම්ෂඩ් අක්තර් මහතා |
| 47 | 2016.10.12 | හංගේරියානු විදේශ කටයුතු සහ වෙළඳ අමාත්‍ය ගරු පීටර් සිජාටෝ මැතිතුමා |

| අංක | දිනය | රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ විදේශ නියෝජිතයන් |
|---|---|---|
| 48 | 2016.10.23 | ඉන්දියානු විදේශ කටයුතු ලේකම් අතිගරු ආචාර්ය එස් ජේෂන්කර් මැතිතුමා |
| 49 | 2016.10.26 | ඇමරිකා එක්සත් ජනපද සාම බලකායේ අධ්‍යක්ෂ කැරී හෙස්ලර් රැඩෙල්ට් මහත්මිය |
| 50 | 2016.10.31 | ජීන් ලැම්බර්ට් මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුත් යුරෝපා සංගම් පාර්ලිමේන්තුවේ දූත පිරිස |
| 51 | 2016.11.27 | එක්සත් ජනපද ශාන්තිකර බලඇණියෙහි ආඥාපති අද්මිරාල් හැරී බී හැරිස් මහතා |
| 52 | 2016.12.12 | තජිකිස්තානු ජනාධිපති අතිගරු එමොමලි රහ්මන් මැතිතුමා |

# 04. ජාතික සංහිඳියාව, සමාජ සුභ සාධනය සහ ආගමික කටයුතු

## 4.1. ජාතික සංහිඳියාව

දශක තුනකට ආසන්න කාලයක් පැවති යුද්ධය 2009 වර්ෂයේ දී අවසන් වුවත්, ශ්‍රී ලාංකිකයන්ට මේ දක්වා සැබෑ ජාතික සංහිඳියාවක් ළඟා කර ගැනීමට නොහැකි වී ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ සියලු ආගමික හා ජන වාර්ගික කණ්ඩායම් සමඟ සාකච්ඡා කර දේශීය නීතිමය රාමුව තුළ සංහිඳියා යාන්ත්‍රණයක් සකස් කිරීමට වර්තමාන රජය ක්‍රියාකරමින් සිටී.

සියලු ජන කොටස්වලට සාධාරණ ලෙස ජීවත් වීමට හැකි සාධාරණ සමාජයක් බිහිකිරීමට නව රජය නොපමාව කටයුතු කරමින් සිටින අතර අන්තර් ආගමික සහජීවනය වර්ධනය කිරීම උදෙසා සෑම ආගමකම එක් උත්සවයක්, ජාතික උත්සවයක් ලෙස අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සැමරීම එහි එක් පියවරකි.

ඒ අනුව, ගරු ජනාධිපතිවරයාගේ හා අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් කොළඹ නවම් මහා පෙරහැර ද වෙසක් පොහොය නිමිතිකොටගෙන කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් 'බුද්ධ රශ්මි' ජාතික වෙසක් මංගල්‍යය ද, ඉස්ලාම් භක්තිකයින් සමරනු ලබන ඉෆ්තාර් උත්සවය ද, කොල්ලුපිටිය වාළුකාරාම මහා විහාරස්ථ වාර්ෂික ඇසළ මහා පෙරහැර ද, හින්දු භක්තිකයින් විසින් සමරන දීපවාලී උත්සවය ද 2016 වර්ෂයේ දී පවත්වන ලදි.

තවද, අග්‍රාමාත්‍යවරයාගේ යාපන නිල සංචාරයන්හීදී පොරොන්දු වූ පරිදි, යාපනය, හාට්ලි විද්‍යාලය වෙත ආසන 26 ක බස් රථයක් ලබා දීම අධ්‍යාපන අමාත්‍යාංශය සමග සම්බන්ධ වී සිදු කරන ලද අතර, කාන්තා කටයුතු අමාත්‍යාංශය හා සම්බන්ධවී, කිලිනොච්චියේ පිහිටුවන ලද ගෘහමූලික කාන්තාවන් සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වැඩ කටයුතු නිරන්තර අධීක්ෂණය ද සිදු කෙරේ.






### 4.1.1 සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය

ජාතික සංහිඳියාව ඇති කරලීමේ තවත් එක් පියවරක් වශයෙන් අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ යෝජනාවකට අනුව, 2015 දෙසැම්බර් මස 16 වන දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත වූ පරිදි, "සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය" ස්ථාපිත කෙරුණු අතර එහි කාර්යභාරය පහත පරිදි වේ.

1) සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ ජාතික මට්ටමේ දේශණ සම්බන්ධීකරණය

2) අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලය, සත්‍ය තොරතුරු සහ සංහිඳියා කොමිෂන් සභාව, වැරදි නිවැරදි කිරීමේ කටයුතු කාර්යාලය, විශේෂ අධිකරණ මණ්ඩල හා අනෙකුත් අදාල සංහිඳියා යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම සඳහා සැලසුම් හා කාල රාමු සම්පාදනය

3) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ මානව හිමිකම් මහ කොමසාරිස්ගේ එක්සත් ජාතීන්ගේ කාර්යාලය ඇතුළු ජාතික සහ ජාත්‍යන්තර ආයතන හා සමඟ සහසම්බන්ධතා පැවැත්වීම

4) උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ සහ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාවල අන්තර්ගත නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රගතිය පසු විපරම සහ සම්බන්ධීකරණය

5) නීති ආධිපත්‍යය, මානව අයිතිවාසිකම්, පරිපාලන හා අධිකරණ ප්‍රතිසංස්කරණයන් ශක්තිමත් කිරීමෙහිලා අවශ්‍ය සම්බන්ධීකරණය

එමෙන්ම මෙම සම්බන්ධීකරණ කාර්යාලය විසින් තොරතුරු විමසීමේ වෙබ් අඩවියක් (www.scrm.gov.lk) යාපනයෙහි දියත් කළ අතර, අතුරුදන්වූවන් පිළිබඳව කාර්යාලයක් ද ස්ථාපිත කරන ලදි. නීති සම්පාදනය ද ඇතුළුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මෙම වසර තුළදී ඉටු කරන ලදී. එම පනත් කෙටුම්පත පනතක් ලෙස; 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත, පාර්ලිමේන්තුවේ සම්මත වූ අතර2017 වසර සඳහා අය-වැය ඇස්තමේන්තුව ද ඉදිරිපත් කර ඇත.

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධ මහලේකම් කාර්යාලය යටතේ, සංහිඳියා යාන්ත්‍රණය උදෙසා ප්‍රචාරණ කාර්ය සාධක බලකාය පිහිටුවා ඇත.

මෙම කාර්යාලය මගින් 2016 වසර තුළ මහජනතාව දැනුවත් කිරීම සඳහාත් ඔවුන්ගේ අදහස් ලබාගැනීම සඳහාත් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් හා සම්බන්ධීකරණයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

මෙයට අමතරව මෙරටට පැමිණි විදේශ දූත පිරිස් වල ඉහල පෙලේ නිලධාරීන් සමග ද ජපන්, ඕස්ට්‍රේලියාව සහ බෙල්ජියම යන රටවල තානාපතිවරුන් සමග ද, සංක්‍රමිණයින් පිළිබඳ ජාතින්තර සංවිධානයේ (IOM) ප්‍රධානීන් සමගද, එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරකවරයා සමග ද සංක්‍රාන්තීය යුක්ති යාන්ත්‍රණය පිළිබඳවත් ඒ සඳහා ඔවුන්ගෙන් ලබාගත හැකි සහය පිළිබඳවත් සාකච්ඡා පවත්වා ඇත.

දැනට ක්‍රියාත්මක සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳව ආරක්ෂක අංශයේත්, ත්‍රිවිධ හමුධාවේත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සංවාදයක් එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරකවරයාගේ සම්බන්ධීකරණයෙන් කොළඹ, ගාල්ල සහ යාපනය යන ස්ථානයන්හිදී පවත්වන ලදී.

ඉහත කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ද සිදු කර ඇත.

### 4.1.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් ලබා ගැනීමේ කමිටුව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීමට කමිටුවක් පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල විසින් ගනු ලැබූ තීරණය අනුව 2015.12.16 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් ලබා ගැනීමේ කමිටුව පත්කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් මහජන අදහස් විමසා තහවුරු කර ගනිමින්, එම අදහස් කමිටු නිර්දේශය ද සමඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ඉදිරිපත් කිරීම මෙහි ප්‍රධාන කාර්යභාරය විය.

මෙම කමිටුව, අධි නීතිඥ ලාල් විජේනායක මහතාගේ සභාපතීත්වයෙන් යුක්තව පිහිටවනු ලැබූ අතර, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතන නියෝජිතයන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්, දේශපාලන ක්‍රියාකාරීන් හා සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින්ගෙන් එය සමන්විත වේ.

මහජන අදහස් විමසීම සඳහා මෙම කමිටුව විසින් දිස්ත්‍රික්ක 25 තුළ, එක් දිස්ත්‍රික්කයක් සඳහා දින 02ක් බැගින් ද කොළඹ දිස්ත්‍රික්කය සඳහා දින 08 ක් ද රැස්වීම් පවත්වන ලද අතර, පහත සඳහන් විෂයයන් විස්ස (20) පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් ස්වකීය නියෝජනයන් ලිඛිතව හෝ වාචිකව ඉදිරිපත් කරන ලෙස මහජනතාවට ආරාධනය කෙරිණ.

1) රාජ්‍යයේ ස්වාභාවය
2) ආණ්ඩුක්‍රමයේ ස්වරූපය (විධායක ජනාධිපති ක්‍රමය හෝ පාර්ලිමේන්තු ක්‍රමය)
3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහය
4) පුරවැසිභාවය, ආගම, මූලික අයිතිවාසිකම් හා යුතුකම්, භාෂා අයිතිය, කණ්ඩායම් අයිතිය හා රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම
5) ව්‍යවස්ථාදායකය (ඒක මණ්ඩල/ද්වි මණ්ඩල)
6) පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය/ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය
7) ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය අතර බලය වෙන් කිරීම
8) අධිකරණයේ ස්වාධිපත්‍යය හා අධිකරණ ව්‍යුහය
9) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව
10) බල හවුල්කාරිත්වය, බලය පැවරීම හා පළාත් පාලනය
11) කේන්ද්‍රයේ බල හවුල්කාරීත්වය
12) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය හා ස්වාධීන කොමිෂන් සභා

13) රාජ්‍ය සේවය

14) මැතිවරණ ප්‍රතිසංස්කරණ

15) පනත් පිළිබඳ අධිකරණ අධීක්ෂණය

16) පාර්ලිමේන්තු ක්‍රමය යටතේ ජනාධිපතිගේ බලතල

17) පාර්ලිමේන්තු ක්‍රමය යටතේ ජනාධිපති තෝරා පත් කිරීම

18) මහජන ආරක්ෂාව

19) මූල්‍ය පරිහරණය

20) වෙනත් කරුණු

සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින්, වෘත්තීය සමිති, වෘත්තීයවේදීන්, ස්වාධීන කමිටු ආදිය නියෝජනය කරමින් පුද්ගලයන් 2,216 ක් කමිටුව වෙත අදහස් ඉදිරිපත් කරන ලදි. ඊට අමතරව, ආගමික නායකයින්, ගොවි ජනතාව, විද්වතුන්, වෘත්තීයවේදීන් සහ ශිෂ්‍යයන් නියෝජනය කරමින්, 3000 කට අධික ලිඛිත නියෝජනයන් ලැබිණ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව විසින්, ඉහත නියෝජනයන් සම්බන්ධයෙන් ස්වකීය විශ්ලේෂණයන් ඇතුළත්ව භාෂාත්‍රයෙන් සකසන ලද වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. එහි පිටපත් විශ්වවිද්‍යාල පුස්තකාල, මහජන පුස්තකාල, ප්‍රධාන රාජ්‍ය ආයතන, උපරිමාධිකරණය, අභියාචනාධිකරණය හා වෘත්තීමය ආයතනවලට ලබා දී ඇත. ඊට අමතරව සෘජු ප්‍රවේශය සඳහා (Online Access) අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවියෙහි භාෂාත්‍රයෙන්ම මෙම වාර්තාව පළකර ඇත.



## 4.2. සමාජ සේවා

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ, අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් 2016 වර්ෂයේ දී පහත සඳහන් සමාජ සුභසාධන වැඩසටහන් සිදු කරන ලදි.

### 4.2.1. සිංහල සහ හින්දු අලුත් අවුරුදු උළෙල සැමරීම

අග්‍රාමාත්‍ය කාර්යාලයේ සුභසාධක සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන බක්මහ උළෙල, 2016 අප්‍රේල් මස 25 වන දින බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බළකා මූලස්ථානයේදී අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මේ සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවෝ ඇතුළු 600 කට අධික පිරිසක් සහභාගී වූහ. සාමාජික සමාජිකාවන්ගේ කුසලතා, අන්‍යොන්‍ය සුහදතාවය සහ කණ්ඩායම් හැඟීම් වර්ධනය කිරීමේ අරමුණෙන් කණ්ඩායම් සහ කේවල තරඟ රාශියක් එහිදී පැවැත්වුණි.









### 4.2.2. ලේ දන්දීමේ ව්‍යාපාරය

අග්‍රාමාත්‍ය කාර්යාලය හා ජාතික රුධිර පාරවිලයනය සේවය ඒකාබද්ධවී, ලේ දන්දීමේ වැඩසටහනක් 2016.04.26 වන දින අග්‍රාමාත්‍ය කාර්යාලයේ දී පවත්වන ලදී. එහිදී අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරී මහත්ම මහත්මීන් සිය දෙනෙකු පමණ ලේ දන්දීමේ කර්තව්‍යයට දායකත්වය සැපයනු ලැබීය.

### 4.2.3. මීරිගම වැඩිහිටි නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම

අග්‍රමාත්‍ය කාර්යාලය, මයුර අම්මාන් සුභසාධන සංගමය සමඟ සම්බන්ධීකරණය වී, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන "සෙත් සෙවණ" වැඩිහිටි නිවාසය ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙම වැඩසටහන යටතේ එක් වැඩිහිටි කාන්තා නේවාසිකාගාරයක් සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කරන ලද අතර එහි පොළව මත පිඟන් ගඩොල් ඇතිරීම, නව ඇඳන් කොට්ට මෙට්ට සහ ඇඳ ඇතිරිලි ලබා දීම ද එම වැඩසටහනට ඇතුළත් විය. ප්‍රතිසංස්කරණය කරන ලද නේවාසිකාගාරය, අග්‍රාමාත්‍ය ලේකම් ඊ එම් එස් බී ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් 2016 මැයි මස 07 වන දින විවෘත කරන ලද අතර, එම අවස්ථාවේ දී පළතුරු පැළ 100 ක් රෝපණය කිරීම ද සිදු විය.






## 4.3. ආගමික කටයුතු

නව රජය පත්වීමෙන් අනතුරුව බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි යන ආගම් අතර, ආගමික සංහිඳියාව ඇතිකරලීමේ අරමුණින්, සෑම ආගමක් ම නියෝජනය වන පරිදි එක් ප්‍රධාන ආගමික වැඩ සටහනක් අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ජාතික මට්ටමින් සැමරීමට කටයුතු කර ඇත. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 4.3.1. කොළඹ නවම් මහා පෙරහැර

හුණුපිටිය, ගංගාරාම විහාරස්ථානය හා අග්‍රාමාත්‍ය කාර්යාලය ඒකාබද්ධව සංවිධානය කරන ලද කොළඹ නවම් මහා පෙරහැර, 2016 පෙබරවාරි මස 21 සහ 22 යන දෙදින තුළ උත්කර්ශවත් අන්දමින්, සමස්ත කොළඹ නගරයම ඒකාලෝකමත් කරමින් වීථි සංචාරය කරන ලදී.

මෙම නවම් මහා පෙරහැර අලි ඇතුන් 75 කට ආසන්න ප්‍රමාණයකින් විචිත්‍රවත් වූ අතර, උඩරට, පහතරට හා සබරගමුව කලා සම්ප්‍රදායන්ට අයත් නර්ථන අංග හා වෙනත් අලංකාර නර්ථන අංග රාශියක් ඉදිරිපත් කරමින් කලා ශිල්පීන් 7000 ක් පමණ මේ සඳහා සහභාගි විය.

මෙවර කොළඹ නවම් මහා පෙරහැර සමාරම්භක දිනය වූ 2016 පෙබරවාරි මස 21 වන දින සධාතුක කරඩුව මංගල හස්තිරාජයා මත තැන්පත්කර පෙරහැරේ කටයුතු ආරම්භ කිරීම සඳහා ජනාධිපති, අතිගරු මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා සහභාගි වූ අතර, පෙරහැරේ දෙවන දිනය වූ පෙබරවාරිමස 22වන දින සධාතුක කරඩුව මංගල හස්තිරාජයා මත තැන්පත්කර පෙරහැරේ කටයුතු ආරම්භ කිරීම අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.

මෙම පෙරහැර නැරඹීම සඳහා ලක්ෂ සංඛ්‍යාත දේශීය හා විදේශීය නරඹන්නන් පිරිසක් සහභාගී වූ අතර, රූපවාහිනී නාලිකා ඔස්සේද විශාල පිරිසකට පෙරහැර නැරඹීම සඳහා අවස්ථාව උදාවිය. එසේම, මෙම පෙරහැර දේශීය කලා ශිල්පීන්ගේ දක්ෂතා ලොවට කියාපෑමටත්, එම කලා සම්ප්‍රදායන් තවදුරටත් රැක ගැනීමටත් මහඟු අවස්ථාවක් විය.

### 4.3.2. මහා සංඝරත්නය දහස්නමක් විෂයෙහි අරලියගහ මන්දිරයේදී පිරිනමන ලද සංඝගත දක්ෂිණාව

අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සංවිධානය කරන ලද මහා සංඝගත දක්ෂිණාව ජනාධිපති, අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ හා අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ මැති ඇමතිවරුන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන්, 2016 මාර්තු මස 08 වෙනි දින අරලියගහ මන්දිරයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී සාර්ථක ලෙස පැවැත්විණි.

මෙම සංඝගත දක්ෂිණාව සඳහා ත්‍රෛයි නිකායික මහා නායක හිමිවරුන්, අනු නායක හිමිවරුන්, සංඝ නායක හිමිවරුන් ඇතුළු මහා සංඝරත්නය දහසකට අධික සංඛ්‍යාවක් සහභාගි වූහ. එහිදී, සෑම භික්ෂූන්වහන්සේ නමක් විෂයෙහිම අෂ්ඨපරිෂ්කාර, සෙසු පිරිකර හා මුදල් පිරිකර පූජා කරන ලදී.






### 4.3.3. සර්වඥධාතූන් වහන්සේලා ඇතුළු බෞද්ධ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති භාණ්ඩ ප්‍රදර්ශනය

පකිස්ථාන අග්‍රාමාත්‍ය, ගරු නවාස් ෂරිෆ් මැතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරයේදී ඉස්ලාමාබාද් නුවර පිහිටි තක්ෂිලා කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා තැන්පත්කර ඇති සර්වඥධාතූන් වහන්සේලා ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කිරීම සඳහා ලබා දෙන බවට අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙත පළකළ එකඟතාවයට අනුව, එම සර්වඥධාතූන් වහන්සේලා 2016 මැයි මස 19 වන දින ශ්‍රී ලංකාවට වැඩම කරන ලදී.

මෙම සර්වඥධාතූන් වහන්සේලා, 2016 මැයි මස 21 වන දින සිට මැයි මස 25 වන දින දක්වා අරලියගහ මන්දිරයේදී ද මැයි මස 26 වන දින සිට ජූනි මස 25 වන දින දක්වා දිවයිනේ විවිධ ප්‍රදේශ වල පිහිටි විහාරස්ථාන 17 කදී ද ප්‍රදර්ශනය කරන ලද අතර, සර්වඥ ධාතූන් වහන්සේලා වන්දනා කිරීම සඳහා ලක්ෂ සංඛ්‍යාත පිරිසක් සහභාගි විය.

ප්‍රදර්ශනය අවසානයේදී එනම්, 2016 ජූනි මස 26 වන දින අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් මෙම සර්වඥ ධාතූන් වහන්සේලා රන් කරඬුවක තැන්පත් කර තක්ෂිලා කෞතුකාගාරයේ නිලධාරීන් වෙත නිල වශයෙන් භාරදෙන ලදී.

අග්‍රාමාත්‍ය කාර්යාලය, බුද්ධ ශාසන අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව යන ආයතන ඒකාබද්ධව මෙම සර්වඥධාතූන් වහන්සේලා ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී.

ගන්ධාර දේශයෙන් වැඩම කරන ලද සර්වඥධාතූන් වහන්සේලා ප්‍රදර්ශනය හා සමගාමීව නීලගිරි ධාතූන් වහන්සේලා ඇතුළු බෞද්ධ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති භාණ්ඩ ප්‍රදර්ශනයක්ද, 2016 මැයි මස 21 වන දින සිට 25 දින දක්වා අරලියගහ මන්දිරයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී පැවැත්වූ අතර, එම ප්‍රදර්ශනය 2016 මැයි මස 21 (වෙසක් පොහොය) දින ජනාධිපති, අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ හා අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.

මෙම ප්‍රදර්ශනය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍ය සංස්කෘතික අරමුදල, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික ශිල්ප සභාව, හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල), ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, සෞන්දර්ය විශ්වවිද්‍යාලය, බස්නාහිර, මධ්‍යම, ඌව, දකුණු, වයඹ පළාත් සහ සබරගමුව පළාත් සභාවන්හි සංස්කෘතික අමාත්‍යාංශ යන ආයතන විසින් ප්‍රදර්ශන භාණ්ඩ ඉදිරිපත් කරන ලදී.





### 4.3.4. බුද්ධ රශ්මි ජාතික වෙසක් මංගල්‍යය

ගංගාරාම විහාරස්ථානය හා අග්‍රාමාත්‍ය කාර්යාලය ඒකාබද්ධව සංවිධානය කරන ලද බුද්ධ රශ්මි ජාතික වෙසක් මංගල්‍යය, 2016 මැයි 21 දින සිට 25 දින දක්වා ගංගාරාම විහාරස්ථානය, අරලියගහ මන්දිරය, බේරේ වැව වටරවුම් පාර හා බේරේ වැව ආශ්‍රිතව උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදී.


එසේම, මෙම වෙසක් කලාපය බේරේ වැවේ ජල තලය මත ඉදි කරන ලද විශේෂ වෙසක් නිර්මාණ, බොදු බැති ගී සංදර්ශන, බෞද්ධ මුද්‍රා නාට්‍ය සංදර්ශන, බෞද්ධ ජාතක කතා ඇසුරෙන් ඉදිරිපත් කරන වීදි නාට්‍ය සංදර්ශන, රූකඩ සංදර්ශන, වෙසක් තොරණ, ආදී විවිධ අංගවලින් සමන්විත වූ දැවැන්ත ආගමික, සංස්කෘතික මංගල්‍යයක් විය.

බුද්ධ රශ්මි වෙසක් කලාපය නැරඹීම සඳහා ලක්ෂ සංඛ්‍යාත දේශීය හා විදේශීය නරඹන්නන් පිරිසක් සහභාගී වූ අතර, රූපවාහිනී නාලිකා ඔස්සේද විශාල පිරිසකට මෙම වෙසක් කලාපය නැරඹීම සඳහා අවස්ථාව උදාවිය. මෙය දේශීය නිර්මාණකරුවන්ගේ දක්ෂතා ලොවට කියාපෑමටත්, දේශීය කලා සම්ප්‍රදායන් තවදුරටත් රැකගැනීමටත් මහඟු අවස්ථාවක් විය.









### 4.3.5. ඉෆ්තාර් උත්සවය

ඉස්ලාම් භක්තිකයන් හද බැතියෙන් සමරනු ලබන ඉෆ්තාර් උත්සවය මව්ලවි තුමන්ලාගේ සහ 1500 ක් පමණ ඉස්ලාම් බැතිමතුන්ගේ සහභාගීත්වයෙන් 2016 ජුනි මස 30 දින ජනාධිපති, අතිගරු මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා හා අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.









**4.3.6. කොල්ලුපිටිය වාළුකාරාම මහා විහාරස්ථ වාර්ෂික ඇසළ මහා පෙරහැර**

ආගමික සහජීවනය තුළින් ජාතික සංහිඳියාව ඇති කිරීමේ අරමුණ පෙරදැරිව, කොල්ලුපිටිය වාළුකාරාම මහා විහාරස්ථ වාර්ෂික ඇසළ මහා පෙරහැර 53 වන වරටත් අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධායකත්වයෙන් 2016 ඔක්තෝබර් මස 13 වන දින පැවැත්විණ.

අතිගරු ජනාධිපතිතුමන්ගේ, ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ හා මැති ඇමතිවරුන්ගේ සහභාගීත්වයෙන් උත්කර්ෂවත් අයුරින් පවත්වන ලද මෙම පෙරහැර මංගල්‍යය ඉපැරණි දේශීය නර්තන සම්ප්‍රදායන්ගේ අනන්‍යතාවය විදහා දැක්වෙන උඩරට, පහතරට නර්තනයන් ඇතුළුව විචිත්‍රවත් නර්තන අංග රාශියකින් ද අලංකාරවත් ලෙස සැරසූ හස්තීන් විශාල ප්‍රමාණයකින් ද සමන්විත විය.

එසේම, මෙමෙ පෙරහැර මංගල්‍යය නැරඹීම සඳහා දේශීය හා විදේශීය නරඹන්නන් විශාල පිරිසක් සහභාගීවූ අතර රූපවාහිනී නාලිකා ඔස්සේද බොහෝ පිරිසකට පෙරහැර නැරඹීම සඳහා අවස්ථාව උදාවිය.





### 4.3.7. දීපවාලි උත්සවය

අග්‍රාමාත්‍ය කාර්යාලය හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද දීපවාලි ජාතික උත්සවය 2016 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ හා ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී. හින්දු අලුත් අවුරුද්ද මූලික කොට ගෙන පවත්වනු ලබන මෙම ආගමික උත්සවයේ අරමුණු වනුයේ අඳුර පරයා ආලෝකය ද, නපුර පරදා යහපත ද උදා කිරීමයි.

මෙම උත්සව අවස්ථාවේ දී විෂ්ණු දෙවියන් සඳහා හින්දු පූජකවරුන් විසින් පුද පූජා පැවැත්වීම සහ පාසල් ළමුන් විසින් සංස්කෘතික අංග ඉදිරිපත් කිරීම ද සිදු විය.





# 05. මහජන පැමිණිලි/ දුක් ගැනිවිලි සඳහා සහන සැලසීම

## 5.1. අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබෙන මහජන පැමිණිලි/ දුක් ගැනවිලි අදාළ රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම හා ප්‍රගතිය පසු විපරම් කිරීම

වසර ගණනාවක් තුළ මහජනතාවට විසඳා ගැනීමට නොහැකිව තිබූ ප්‍රශ්න හා ගැටලු විසඳා ගැනීමේ අරමුණින් අග්‍රාමත්‍යවරයා වෙත යොමු කරනු ලබන ලිපි රාශියක් දිනපතා අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබේ.

ඒ අනුව, මෙලෙස ලැබෙන මහජන පැමිණිලි / දුක් ගැනවිලිවලට විසඳුම් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කිරිමේ අරමුණින් අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ මහජන සම්බන්ධතා අංශය ස්ථාපිත කරන ලදී.

එම අංශය මඟින් හඳුනාගෙන ඇති මහජන පැමිණිලි / දුක්ගැනවිලි පහත පරිදි වර්ග කළ හැක.

- ඉඩම් ගැටලු
- නිවාස ගැටලු
- නඩු තීන්දු වලට අදාළ ගැටලු
- සහනාධාර / ජීවනාධාර වන්දි ඉල්ලීම්
- පාසල් සඳහා ළමුන් ඇතුළත් කිරීමට ඉල්ලීම්
- රැකියා ගැටලු
  - රැකියා ඉල්ලුම් කිරීම්
  - නැවත රැකියාවේ පිහිටුවන ලෙස ඉල්ලීම්
  - ස්ථාන මාරුවීම්

- පොදු පහසුකම්
  - මාර්ග ඉදිකිරීම් හා පිළිසකර කිරීම්
  - නළ ජලය සහ විදුලි බලය ලබා ගැනීම සඳහා ඉල්ලීම්

- අක්‍රමිකතා
  - පොලිස් දෙපාර්තමේන්තුවට එරෙහි පැමිණිලි
  - දූෂණ හා වංචා
  - ආයතන ප්‍රධානීන් පත්කිරීමේ අක්‍රමිකතා

- දේශපාලන පළිගැනීම්


2016.10.01 සිට 2016.12.31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ ලැබුණු ලිපි සහ ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් පහත දැක්වේ.

| අංකය | මාසය | මාසයකදී ලද ලිපි සංඛ්‍යාව | පිළිතුරු යවන ලද ලිපි සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ජනවාරි | 4,144 | 3,718 |
| 02 | පෙබරවාරි | 6,903 | 6,768 |
| 03 | මාර්තු | 5,360 | 5,024 |
| 04 | අප්‍රේල් | 2,860 | 2,674 |
| 05 | මැයි | 2,971 | 2,080 |
| 06 | ජූනි | 3,323 | 2,885 |
| 07 | ජූලි | 3,343 | 2,627 |
| 08 | අගෝස්තු | 3,674 | 2,869 |
| 09 | සැප්තැම්බර් | 3,419 | 3,006 |
| 10 | ඔක්තෝබර් | 5,326 | 4,973 |
| 11 | නොවැම්බර් | 3,648 | 3,123 |
| 12 | දෙසැම්බර් | 3,844 | 3,564 |
| | **එකතුව** | **48,815** | **43,311** |

මෙම පැමිණිලි හා දුක් ගැනවිලි සඳහා විසඳුම් ලබාදීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් එම ලිපි කඩිනමින් පහත සඳහන් ආයතන / නිලධාරීන් වෙත යොමු කරන අතර ඊට අදාළ පසුවිපරම් කටයුතු ද සිදු කරනු ලබයි.

- අමාත්‍යාංශ ලේකම්වරු
- දිස්ත්‍රික් ලේකම්වරු
- දෙපාර්තමේන්තු ප්‍රධානීන්
- සංස්ථා / සමාගම් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්
- ප්‍රාදේශීය ලේකම්වරු
- පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්

## 5.2. අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය මගින් මහජන පැමිණිලි / දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට සලසා ඇති පහසුකම්



# **06.** පාර්ලිමේන්තු සහ නීතිමය කටයුතු

## 6.1. පාර්ලිමේන්තු කටයුතු

අග්‍රාමාත්‍ය කාර්යාලයේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අංශයක් පිහිටුවා ඇති අතර එහි කාර්යභාරය පහත පරිදි වේ.

### 6.1.1. අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන් සහ පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම

- **අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන්**

  2016 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා අමාත්‍ය මණ්ඩල සංදේශ 122 ක් හා අමාත්‍ය මණ්ඩල සටහන් 37 ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් එළඹෙන ලද තීරණ අතරින්, අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ක්‍රියා කළ යුතු තිරණ ක්‍රියාත්මක කිරීම හා ඒ හා සම්බන්ධ පසුවිපරම් කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කරනු ලැබේ.

- **පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම**

  අග්‍රාමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට අයත් වන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සංස්ථාවන්ට අදාළව විපක්ෂ හා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉහත කාලසීමාව ඇතුළත අසන ලද වාචික ප්‍රශ්න අතුරින් ප්‍රශ්න 66 කට පමණ පිළිතුරු කෙටුම්පත් කොට ඇත. අතිගරු ජනාධිපතිවරයාගේ විෂය පථය යටතට අයත් වන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වන කරුණු සම්බන්ධයෙන් අසන ලද වාචික ප්‍රශ්න 30 ක් සඳහා පිළිතුරු කෙටුම්පත් කර ඇති අතර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ වන කරුණු සම්බන්ධයෙන් වාචික ප්‍රශ්න 36 ක් සඳහා පිළිතුරු කෙටුම්පත් කර ඇත.

  තවද, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග යටතේ අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ප්‍රශ්න 39 ක් සඳහා පිළිතුරු කෙටුම්පත් කර ඇත. එමෙන්ම ගරු අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව යටතේ ජාතික වැදගත්කමකින් යුත් ප්‍රතිපත්තිමය කරුණු ඔස්සේ සෑම මසකම පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන පළමු බදාදා දින අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන වාචික ප්‍රශ්න 04 ක් සඳහා පිළිතුරු ලබාදීම සිදු කරනු ලබයි. ඒ අනුව මෙම කාල පරාසය තුළ වාචික ප්‍රශ්න 44 කට පිළිතුරු කෙටුම්පත් කිරීමේ කටයුතු සිදු කර ඇත.

### 6.1.2. පාර්ලිමේන්තු වාර්තා සභාගත කිරීම

ජනාධිපතිවරයාගේ හා අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන විෂය කරුණු සම්බන්ධයෙන් වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු අවස්ථාවන්හිදී, විශේෂයෙන් වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා හා ගිණුම් ප්‍රකාශ පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීමට අවශ්‍ය කටයුතු මෙමඟින් සිදු කරනු ලබන අතර, මේ වන විට පහත කරුණු යටතේ වාර්තා 22 ක් පාර්ලිමේන්තු සභාගත කර ඇත.

- **වාර්ෂික වාර්තා**

  1) ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - 2010 සහ 2014
  2) ජාතික පොලිස් කොමිෂන් සභාව - 2013
  3) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව - 2012, 2013 සහ 2014
  4) රණවිරු සේවා අධිකාරිය - 2012 සහ 2013
  5) මුදල් කොමිෂන් සභාව - 2014
  6) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2013
  7) රාජ්‍ය සේවා කොමිෂන් සභාව - 2015
  8) මධ්‍යම පරිසර අධිකාරිය - 2014
  9) පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය - 2012, 2013 සහ 2014

- **කාර්ය සාධන වාර්තා සහ ගිණුම් ප්‍රකාශ**

  1) ශ්‍රී ලංකා නාවික හමුදාව - 2014
  2) ශ්‍රී ලංකා ගුවන් හමුදාව - 2014
  3) රාජ්‍ය සේවා කොමිෂන් සභාව - 2015
  4) මැතිවරණ කොමිෂන් සභාව - 2015
  5) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් දෙපාර්තමේන්තුව

- **වෙනත්**

  1) 2016 මුදල් වර්ෂය සඳහා වන මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ - 01
  2) ශ්‍රී ලංකා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පාලන වාර්තාව - 2014

## 6.2. නීතිමය කටයුතු

විවිධ විෂය කරුණු සම්බන්ධව පනත් කෙටුම්පත්, මූලිකව සකස් කිරීමේ සිට පාර්ලිමේන්තුවේ දී පනතක් ලෙස සම්මත වීම දක්වා සම්බන්ධීකරණ කාර්ය භාරය මෙම අංශය විසින් ඉටු කරනු ලබයි.

ඒ අනුව, 2016.01.01 සිට 2016.12.31 දක්වා කාල පරාසය තුළ පහත සඳහන් කාර්යයන් සිදුකර ඇත.

- අතුරුදහන් වූවන් සඳහා වන කාර්යාලය ස්ථාපිත කිරීම, පරිපාලනමය හා එහි කාර්ය භාරය ඉටු කිරීම සම්බන්ධයෙන් වූ පනත් කෙටුම්පත, නව පනතක් ලෙස සම්මත කිරීම දක්වා සම්බන්ධීකරණ කාර්ය භාරය අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කරන ලදී .

- එමෙන්ම මෙම අංශය මඟින් පහත පරිදි සංවර්ධනය, ඉඩම් කළමනාකරණය, විදේශ මුදල් කළමනාකරණය හා මූල්‍ය කළමනාකරණය මෙන්ම අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යභාරය සම්බන්ධයෙන් ද නව නීති කෙටුම්පත් කිරීම හා පවත්නා නීති කාලානුරූපීව සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

1) ඉඩම් (විශේෂ විධිවිධාන) පනත
2) රජයේ ඉඩම් බැංකු පනත
3) බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය සඳහා වන පනත
4) විදේශ විනිමය පනත
5) ජාතික විගණන පනත
6) සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත
7) ප්‍රාග්ධන ලාභ බදු පනත හඳුන්වා දීම
8) බස්නාහිර මහපුරවර කලාපය සංවර්ධන පනත
9) 2002 අංක 02 දරන බලශක්ති සැපයුම් (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම
10) 2007 අංක 7 දරන සමාගම් පනත සංශෝධනය කිරීම
11) අමාත්‍යවරුන්ට සහ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරුන්ට කර්තව්‍ය පැවරීමේ (අනුෂාංගික විධිවිධාන) පනත
12) බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) (විශේෂ විධිවිධාන) පනත
13) ආයෝජන (විශේෂ විධිවිධාන) පනත

මෙයට අමතරව පාර්ලිමේන්තුව වෙත යෝජනා සම්මතයන් ඉදිරිපත් කිරීම ද සිදු කරනු ලබන අතර, 2016.01.01 සිට 2016.12.31 දින දක්වා පහත යෝජනා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

1) මැතිවරණයකදී හෝ ජනමත විචාරණයකදී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ

2) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ වැටුප් හා දීමනා සංශෝධනය කිරීම

3) ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරුන් හා සාමාජිකයින් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා

එමෙන්ම, අග්‍රාමාත්‍යවරයා වග උත්තරකරු කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩු කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු ද සිදු කරනු ලබයි.

# 07. මානව සම්පත් සංවර්ධනය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

## 7.1. මානව සම්පත් සංවර්ධනය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමත් එමගින් කාර්යාල කටයුතුවල කාර්යක්ෂමව, ඵලදායීව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත් දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කරනු ලැබේ. ඒ අනුව, 2016.01.01 සිට 2016.12.31 දක්වා කාලය තුළ ලබා දී ඇති දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

- **දේශීය පුහුණු වැඩසටහන් සහ පශ්චාත් උපාධි පාඨමාලා**

| # | පාඨමාලාවේ නම | පුහුණු ආයතනය | පුහුණු කාල සීමාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | රියදුරුවරුන්ගේ සහ කාර්යාල කාර්ය සහායකවරුන්ගේ කාර්යභාරය හා වගකීම සම්බන්ධ වැඩමුළුව | නිපුණතා සංවර්ධන අරමුදල | 2016.02.06 දින 01 | 42 |
| 02 | ප්‍රායෝගික මානව සම්පත් කළමණාකරණ පාඨමාලාව | මානව සම්පත් පුහුණු හා සංවර්ධන ආයතනය | 2016.02.19 දින 01 | 1 |
| 03 | ශබ්දාගාරයක් තුළ හා ඉන් පිටත ශබ්ද පරිපාලන කළමණාකරණය | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 2016.02.20 සිට 2016.05.08 (සති අන්ත දින 20) | 1 |
| 04 | රාජ්‍යෝපාය සහ ලෝක කටයුතු ඩිප්ලෝමාව | බණ්ඩාරනායක ජාත්‍යන්තර පුහුණු ආයතනය | වසර 01 | 6 |
| 05 | පරිගණක මූලික රියදුරු බලපත්‍ර පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය(SLIDA) | 2016.03.14 සිට 2016.04.01 | 1 |
| 06 | සාමාන්‍ය ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව | බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනය | 2016.07.19 සිට 2016.09.22 | 1 |
| 07 | ඩිජිටල් ඡායාරූපකරණය | ඡායාරූපකරණය පිළිබඳ පාසල - හැගොඩ | මාස 06 | 1 |
| 08 | අලාභ, අලාභ ආවරණය කර ගැනීම සහ ඉවත් කිරීම සම්බන්ධ වැඩමුළුව | නිපුනතා සංවර්ධන අරමුදල | 2016.07.28 සිට 2016.07.29 | 1 |
| 09 | සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය - පශ්චාත් උපාධි පාඨමාලාව 2016/2017 | කොළඹ විශ්වවිද්‍යාලය | වසර 01 | 1 |
| 10 | රාජ්‍ය කළමණාකාරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව 2015/2017 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය(SLIDA) | අවුරුදු 02 | 2 |
| 11 | ග්‍රැෆික් නිර්මාණ පාඨමාලාව | විජය ග්‍රැෆික් ලිමිටඩ් පුද්ගලික සමාගම | මාස 06 | 1 |

- විදේශීය පුහුණු වැඩසටහන්

| # | පාඨමාලාව | රට | පුහුණු කාල සීමාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | රාජ්‍ය පාලනය හා පරිපාලනය පිළිබඳ පාඨමාලාව | සිංගප්පූරුව | 2016.01.14<br>2016.01.23 | 1 |
| 2. | රාජ්‍ය සේවයේ ප්‍රගමනය සඳහා ඊ - රාජ්‍ය උපායමාර්ග සංවර්ධනය කිරීම පිළිබඳ පාඨමාලාව | කටාර් | 2016.01.24<br>2016.01.30 | 3 |
| 3. | ආර්ථික වර්ධනය පිළිබඳ පාඨමාලාව | ඇ.එ.ජ | 2016.02.07<br>2016.02.12 | 1 |
| 4. | ජාත්‍යන්තර සහභාගීවන්නන් සඳහා වන උපායමාර්ගික විශ්ලේෂණය - 2016 | මැලේසියාව | 2016.07.19<br>2016.08.07 | 1 |
| 5. | පරිපාලන සංවර්ධන - නවීකරණය හා පරිණාමණය පිළිබඳ පාඨමාලාව | මැලේසියාව | 2016.07.23<br>2016.08.01 | 1 |
| 6. | ආර්ථික සංවර්ධනය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2016.08.17<br>2016.09.19 | 7 |
| 7. | සංවර්ධනය වෙමින් පවතින රටවල නිලධාරීන් සඳහා වෙළඳ හා ආයෝජන කටයුතු පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2016.08.25<br>2016.09.14 | 2 |
| 8. | “එකම කලාපයක් හා එකම මාවතක්” ඔස්සේ වන රටවල් සඳහා සහයෝගීතාවය සහතික කිරීම හා පැවරීම පිළිබඳ පාඨමාලාව | චීනය | 2016.09.09<br>2016.09.27 | 1 |
| 9. | නායකත්ව පුහුණු (රාජ්‍ය අංශ) පාඨමාලාව | සිංගප්පූරුව | 2016.09.25<br>2016.10.01 | 2 |
| 10. | ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා ජාතික රාජ්‍ය පරිපාලනය පිළිබඳ පාඨමාලාව | ජපානය | 2016.10.10<br>2016.10.29 | 1 |
| 11. | චීන ආධාර වැඩ සටහන් සඳහා මූල්‍ය සේවාවක් පාඨමාලාව | චීනය | 2016.10.11<br>2016.11.24 | 3 |
| 12. | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා චීනයේ සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ වැඩමුළුව | චීනය | 2016.10.13<br>2016.11.02 | 2 |
| 13. | ආර්ථික ගෝලීයකරණය සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා චීනයේ නිෂපාදනය | චීනය | 2016.10.13<br>2016.11.02 | 3 |
| 14. | දකුණු ආසියානු රටවල රාජ්‍ය තාන්ත්‍රිකයින් සඳහා වන වැඩමුළුව | චීනය | 2016.11.02<br>2016.11.24 | 2 |

## 7.2. තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

ඊ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගත වෙමින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික දුර්වලතා හා අවශ්‍යතා හඳුනා ගැනීමත්, රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික අවශ්‍යතා සපුරාලීමත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ මූලික අභිමතාර්ථය වේ.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය (Official Website)**

  අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම මගින් භාවිත කරන්නන් හට කාලීන හා නිවැරදි තොරතුරු කඩිනමින් ලබාදීමට හැකියාව ලැබී ඇත. මෑත කාලයේදී රාජ්‍ය අංශයේ වෙබ් අඩවිවලට එල්ල වූ සයිබර් ප්‍රහාරයන් (Cyber Attacks) සැලකිල්ලට ගෙන අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවියෙහි ආරක්ෂණය ඉහළ දැමීම සඳහා (Web Application Firewall) පද්ධතියක් අලුතින් ස්ථාපිත කරන ලදී. තවද නිල වෙබ් අඩවියේ ක්‍රමලේඛණයේ (Source Code) හා ස්ථාපනයේ (Web hosting) තව දුරටත් ඌනතාවයන් පිළිබඳ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) ලබාදී අති නිර්දේශ අනුව කටයුතු කරමින් එම ඌනතාවයන් ඉවත් කර නිල වෙබ් අඩවියේ අරක්ෂාව තහවුරු කර ඇත. වෙබ් අඩවියේ පූර්ණ පාලනය මේ වන විට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සතුව පවතී.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර මේල් සර්වරය (Internal Mail Server)**

  අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර ඊ මේල් සේවාව සඳහා භාවිතා කළ සර්වරය 2008 වර්ෂයේදී මිලදී ගෙන තිබූ අතර එය වර්තමාන අවශ්‍යතාවයට ප්‍රමාණවත් නොවීය. එබැවින් ඊ මේල් සේවාව සඳහා වැඩි ධාරිතාවයකින් හා හැකියාවකින් යුතු නව සර්වර් පරිගණකයක් මිලදී ගෙන ස්ථාපිත කළ අතර එමගින්, භාවිතා කරන ලද මෘදුකාංගයේ නවතම සංස්කරණයට (Latest Version) යාවත්කාලීන කළ හැකි විය. තවද, ඊ - මේල් සේවාවෙහි Spam Mail ඉවත් කිරීම සඳහා නව Spam Firewall පද්ධතියක් අලුතින් ස්ථාපිත කරන ලදී.

  අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර ඊ මේල් සේවාවෙහි සිදුකරන ලද ඉහත යාවත්කාලීන කිරීම් මගින් වාඩාත් කාර්යක්ෂම සහ ඵලදායි ඊ මේල් සේවාවක් පවත්වා ගැනීමේ හැකියාව ලැබී ඇත.

- **තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඉහළ නැංවීම**

විදුලිය බිඳ වැටීම් මගින් තොරතුරු තාක්ෂණික සේවාවන්ට සිදුවන බාධාව සැලකිල්ලට ගෙන වැඩි ධාරිතාවයකින් යුතු UPS යන්ත්‍රයක් ස්ථාපිත කර ඇත.

අග්‍රාමාත්‍ය කාර්යාලයීය, අරලිය ගහ මන්දිරය පරිශ්‍රයේ හා මල් පාර පරිශ්‍රයේ කාර්යාලවල අභ්‍යන්තර ජාල පද්ධතියේ ඇති ඌනතාවයන් හඳුනාගෙන ඒවා ඉවත් කරමින් නව පහසුකම් සහිත කාර්යක්ෂම ජාල පද්ධතියක් ඇති කිරීම සඳහා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නියෝජිත ආයතනය මගින් ක්‍රියාත්මක LGN 2.0 ව්‍යාපෘතිය යටතේ කටයුතු සම්පාදනය කරමින් පවතී.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ පහත සඳහන් ක්‍රියා පටිපාටි කළමණාකරණය කිරීම (Workflow Management)**

1) රැස්වීම් සංවිධානය හා කළමනාකරණය
2) අමුත්තන් පැමිණීම කළමනාකරණය
3) වැඩ පැවරීම
4) ලිපි ලේඛණ කළමනාකරණය

ඉහත ක්‍රියා පටිපාටි කළමනාකරණය සඳහා වඩාත් පහසුකම් වලින් යුතු මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නියෝජිත ආයතනය හරහා කටයුතු සම්පාදනය කරමින් පවතී.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර භාවිතය සඳහා මෘදුකාංග පද්ධති නිපදවීම**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර ආයතන කටයුතු පහසු කර ගැනීම සඳහා අවශ්‍ය මෘදුකාංග, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මඟින් නිපදවීමට කටයුතු යොදා ඇත. එමගින් මෘදුකාංග සඳහා යන වියදම අවම කර ගත හැකි අතර, පිටපත් ලෙස නවීකරණය කිරීමේ හැකියාවද (version update) පවතී. ඒ අනුව දැනට ලිපි කළමනාකරණය සඳහා ලිපි කළමනාකරණ පද්ධතියක් (Document Managment System) නිර්මාණය කර ඇති අතර එය අභ්‍යන්තර ලිපි කටයුතු පහසු කිරීම සඳහා ඵලදායීව යොදාගෙන ඇත.

- **රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම**

  අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් වලට අදාළව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මූලික වී ක්‍රියා කරනු ලැබේ.

මීට අමතරව, ආයතනයේ පහත සඳහන් කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සහාය ලබාදෙනු ඇත.

1) කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ ප්‍රායෝගික තොරතුරු තාක්ෂණික පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම

2) ආයතනයේ තොරතුරු තාක්ෂණික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම හා ක්‍රියාත්මක කිරීම

3) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ සේවා ගිවිසුම් අත්සන් කර යාවත්කාලීනව පවත්වාගෙන යාම

4) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික උපකරණ මිලදී ගැනීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු වලට සහභාගිවෙමින් අදාළ පිරිවිතර සැකසීම හා නිර්දේශයන් ලබාදීම

## 7.3. අරලියගහ මන්දිර පරිශ්‍රය කළමනාකරණය

1) අරලියගහ මන්දිර පරිශ්‍රයෙහි ඉදිකිරීම් කටයුතු අතරමග නැවතී තිබූ 05 මහල් පරිපාලන ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කොට ඉදිකිරීම් වැඩ කටයුතුවලින් 90% කට වැඩි ප්‍රමාණයක් නිම කිරීම.

2) අග්‍රාමාත්‍ය ආරක්ෂක කොට්ඨාශයේ නිලධාරීන්ගේ භාවිතය සඳහා තුන්මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම හා අග්‍රාමාත්‍ය ආරක්ෂක කොට්ඨාශයේ කාන්තා නිලධාරිනියන් සඳහා වූ පහසුකම් නිවාස නවීකරණය කිරීම.

3) අරලියගහ මන්දිරයේ ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ලට යාබද තුන් මහල් පරිපාලන ගොඩනැගිල්ලෙහි සතරවැනි මහලෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම.

4) ගරු අග්‍රාමාත්‍යතුමා සහ මාධ්‍ය නියෝජිතයන් අතර පැවැත්වෙන හමුවීම් හා මාධ්‍ය සාකච්ඡා සඳහා එළිමහන් මාධ්‍ය මණ්ඩපයක් ස්ථාපිත කිරීම.

5) අරලියගහ මන්දිර පරිශ්‍රයේ ප්‍රධාන පිවිසුමේ සිට මන්දිර පරිශ්‍රය දක්වා වන කොටසේ මාර්ගය නවීකරණය කිරීම.

6) පරිසර අමාත්‍යාංශය හා කොළඹ මහා නගර සභාව සමඟ සම්බන්ධීකරණය කරමින් එම ආයතනවල සහයෝගය ඇතිව කසල කළමනාකරණ වැඩ සටහනක් ආරම්භ කිරීම.

7) අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා හා වෙනත් සුවිශේෂී අමුත්තන් සහභාගී වන අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන උත්සව හා විශේෂ අවස්ථාවන් 15 ක් සාර්ථකව සංවිධානය කොට පැවැත්වීම.

8) ජාතික වැදගත්කමකින් යුක්ත වෙනත් අමාත්‍යාංශ/ආයතන මඟින් සංවිධානය කරනු ලැබූ විශේෂ උත්සව අවස්ථාවන් අරලියගහ මන්දිර පරිශ්‍රයේ ප්‍රධාන ශාලාවේ පැවැත්වීම සඳහා සහ ඒවා සාර්ථකව සංවිධානය හා සම්බන්ධීකරණය කිරීම.

9) ඩිජිටල් මාධ්‍ය ඒකකයක් ආරම්භ කිරීම සහ අරලියගහ මන්දිර පරිශ්‍රයේ ගබඩා කළමනාකරණය සඳහා තොග ලේඛණ දත්ත පදනමක් සකස් කර ක්‍රියාත්මක කිරීම

# **08.** මූල්‍ය ප්‍රගතිය

## 8.1. මූල්‍ය ප්‍රගතිය

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 02 යටතේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ වාර්ෂික වියදම් දැරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදනය සැලසීම සිදු වේ.මෙම ප්‍රතිපාදන අග්‍රාමාත්‍ය කාර්යාලය, සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා යන ප්‍රධාන ව්‍යාපෘති 02 යටතේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර ඇත. 2016 වර්ෂයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 878 ක් ද ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 496 ක් ද ලෙස සමස්ත ප්‍රතිපාදනය රුපියල් මිලියන 1374 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. ඒ අනුව 2016 වර්ෂයේ ව්‍යාපෘතිගත ප්‍රතිපාදනවල මූල්‍ය ප්‍රගතියේ සාරාංශය පහත පරිදි වේ.

| ව්‍යාපෘතිය | මුළු ප්‍රතිපාදනය (රුපියල් මිලියන) | | මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | | | |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | | ප්‍රාග්ධන | |
| අග්‍රාමාත්‍ය කාර්යාලය | 436 | 430 | 417 | 96% | 362 | 85% |
| සාමාන්‍ය පරිපාලන හා ආයතනික සේවා | 442 | 66 | 335 | 76% | 53 | 81% |
| **එකතුව** | **878** | **496** | **752** | **86%** | **415** | **84%** |

අග්‍රාමාත්‍ය කාර්යාල ව්‍යාපෘතිය යටතේ අරලියගහ මන්දර පරිශ්‍රය,විසුම්පාය,නුවරඑළිය හා බෙන්තොට අග්‍රාමාත්‍ය නිල නිවාස සඳහා වූ පරිපාලන,සැපයීම් හා නඩත්තු හා වෙනත් කටයුතුවලට අදාල වියදම් මෙන් ම නව ඉදිකිරීම්,කාර්යාල උපකරණ ලබාගැනීම්, වාහන අත්පත් කර ගැනීම් ආදි වූ පුනරාවර්තන හා ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් දැරීම සිදුකරනු ලැබේ.

සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා ව්‍යාපෘතිය යටතේ අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය ,සංහිඳියා යාන්ත්‍රණ ලේකම් කාර්යාලය,ජපන් ශ්‍රී ලංකා සහයෝගිතා ලේකම් කාර්යාලය,දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය යන ඒකකයන්හි පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දැරීම සිදුකරනු ලැබේ.

ඒ අනුව 2016 වර්ෂයේ වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සිදු කරනු ලැබූ ප්‍රමුඛ ව්‍යාපෘති පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු පහත පරිදි වේ.

1) අරලියගහ මන්දිර පරිශ්‍රය තුළ ඉදිකරනු ලබන පස් මහල් ගොඩනැගිල්ලෙහි 75% ක පමණ භෞතික ප්‍රගතියක් ලබා කර ගැනීම හා රු.මිලියන 85 වියදම් දැරීම සිදු කරන ලදි.
2) නුවරඑළියෙහි පිහිටි අග්‍රාමාත්‍ය නිල නිවස සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීම හා බෙන්තොට අග්‍රාමාත්‍ය නිල නිවස අළුත්වැඩියා කිරීම දරන ලද වියදම රුපියල් මිලියන 76 ක් වේ.
3) සංහිඳියා යාන්ත්‍රණ ලේකම් කාර්යාලය සඳහා නව කාර්යාල පරිශ්‍රයක් කුලී පදනම මත ලබා ගැනීම හා එහි කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා කාර්යාල පිරි සැකැස්ම,කාර්යාල උපකරණ ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 68 ක වියදම් දරන ලදි.
4) අග්‍රාමාත්‍ය ආරක්ෂක ඒකකයට අවශ්‍ය ගිලන් රථයක්,වාහන රැගෙන යන රථ 02 මිලදී ගැනීම සඳහා දරන ලද වියදම රුපියල් මිලියන 34ක් වේ.
5) අග්‍රාමාත්‍ය මෙහෙයුම් කාර්යාලය සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීම,යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 10 ක වියදම් දරන ලදි.